# පටුන

**අන්තර්ගතය** **පිටු අංක**


| | | |
|---|---|---|
| 1. | විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ ඓතිහාසික පසුබිම | 1 |
| | | |
| 2. | දැක්ම, මෙහෙවර, සාමූහික අභිමතාර්ථ | 2 |
| | | |
| 3. | සාමූහික තොරතුරු | 3 |
| | | |
| 4. | ගරු සෞඛ්‍ය අධ්‍යක්ෂතුමා වෙත වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා වන සභාපතිවරයාගේ ලිපිය | 4 |
| | | |
| 5. | මානව සම්පත් සංවර්ධනය | 05~06 |
| | | |
| 6. | 2013 වර්ෂය තුලදී ලද ප්‍රධාන ජයග්‍රහණයන් | 07 |
| | | |
| 7. | ආරෝග්‍යශාලාව මගින් ලබා දෙන ලද සේවාවන් පිළිබඳ විශ්ලේෂණය | 08~20 |
| | | |
| 9. | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය | 21~22 |
| | | |
| 10. | 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ආදායම් වියදම් ගිණුම | 23~37 |
| | | |
| 11. | විගණකාධිපතිගේ සහතිකය සහ 1971 අංක 38 දරණ මුදල් පණතේ 14(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපතිවරයාගේ වාර්තාව | 38~46 |
| | | |
| 12. | 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාව පදනම් කරගෙන ඇති පැහැදිලි කිරීම් සහ අඩු ලුහුඩු තත්ත්වයන් මගහරවා ගැනීමට ගෙන ඇති විසඳුම් ක්‍රියාමාර්ග | 47~56 |

## විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයෙහි වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය - 2013

# විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලාව

# සීදූව

## ඓතිහාසික පසුබිම

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල ස්ථාපිත කරන ලද්දේ 1998 අංක 31 දරණ විජය කුමාරතුංග පදනම ලෙසින් නම්කොට ඇති පාර්ලිමේන්තු පනතට අනුව වන අතර එය 1999 නොවැම්බර් මස 12 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පල කරන ලදි.

1998 පෙබරවාරි 16 වන දින සාහසික ලෙස ඝාතනය කෙරුණු විජය කුමාරතුංග මහතා අනුස්මරණය කිරීම පිණිස මෙම විජය කුමාරතුංග අනුස්මරණ රෝහල ස්ථාපිත කරන ලදි. සීදූව මීසම භාර පියතුමානන් කෙනෙකු වූ ගෞරවනීය සුනන්ද වනසිංහ පියතුමන් විසින් එවකට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට යෝජනා කරන ලද්දේ විජය කුමාරතුංගයන් උපන් ප්‍රදේශයෙහි හැදීවැඩුණු ප්‍රදේශයෙහි ජනතාව වෙනුවෙන් ආරෝග්‍යශාලාවක් පිහිටු වීම තුළින් ඔහුගේ මානව හිතවාදී යුග මෙහෙවර සැමරීමට හැකිවන බවයි.මෙම යෝජනාව එතුමිය විසින් පිළිගැනිනි.

කටුනායක / සීදූව  නගර සභා සීමාව තුළ කොළඹ - මීගමුව ප්‍රධාන බස් මාර්ගයට මුහුණ ලා පිහිටි සීදූව ප්‍රදේශයේ අක්කර 03 ක පමණ ඉඩම් කොටසක විජය කුමාරතුංග අනුස්මරණ පදනම මගින් ඇඳන් 60කින් සමන්විත වාට්ටු 02කින් සහ බාහිර රෝගී අංශයක්ද සහිත වූ පූර්ණ ආරෝග්‍යශාලාවක් ඉදිකරන ලදි.

1999 දී එනම් විජය කුමාරතුංගයන්ගේ උපන් දිනය යෙදී තිබූ ඔක්තෝම්බර් 09 වන දින මෙම ආරෝග්‍යශාලාව  නිල වශයෙන් විවෘත කරනු ලැබූයේ ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපති තුමිය විසිනි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ  1999 අංක 38 දරණ ගැසට් නිවේදනයට අනුව විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ මෙහෙයුම් හා පාලන කටයුතු ඇතුළුව එදිනෙදා කළමනාකරණ කටයුතු විජය කුමාරතුංග රෝහල් මණ්ඩලය වෙත පැවරී ඇති අතර ප්‍රතිපත්තිමය තීරණ ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කෙරුණු ලබයි.

සංවර්ධන කටයුතු වල එක් කොටසක් ලෙස අමතර ගොඩනැගිල්ලක්ද ඉදිකෙරුණු අතර එය ඇඳන් 88 කින්  යුත් අක්ෂි වාට්ටුව කින් යුක්ත වූ අතර 2004 වසර තුල මෙහි සමස්ථ  ඇඳන් ගණන 148 දක්වා වැඩි විය.ජනතාවට වඩාත් ඉහල ගුණාත්මක සේවාවක් ලබාදීමේ අරමුණෙන් යුක්තව 2007 වසර තුළදී පැවති පහසුකම් තවදුරටත් පුළුල්  කෙරෙණු අතර අංග සම්පූර්ණ අක්ෂි වාට්ටුවක් විවෘත කිරීමට මෙම වසර තුළදී හැකි විය.

2011 වර්ෂය තුලදී පොදු ගබඩාවක්, ලේඛණාගාරයක්, රාජකාරී නිල කාමර සහ දේශන ශාලාවකින් සමන්විත වෙනම ගොඩනැගිල්ලක් ඉදි කෙරිණි.

2013 වර්ෂයේදී වර්ග අඩි 4386 කින් සමන්විත තෙමහල් ගොඩනැගිල්ලක් NERD ආයතනයේ උපදේශ තත්ත්වය යටතේ ඉදි කරන ලදී. මෙම ගොඩනැගිල්ල ක්ෂුද්‍රජීවී රසායනාගාරයකින්, තුවාල සත්කාර ඒකකයකින්, නිල කාමර ආදී අංග වලින් සමන්විත වේ. ටෙන්ඩර් පටිපාටිය අවසන්ව ඇති මෙම ගොඩනැගිල්ලේ භෞතික වටිනාකම රු. මිලියන 12.431 ලෙස හඳුනාගෙන ඇත. මේ වන විට මෙම ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කර ඇත.

2013 වන විට වාට්ටු 5 ක් සහ ඇඳන් 164 දක්වා වර්ධනයක් සිදු වී ඇති අතර භාවිතයට නොගත් සියළුම හිස් අවකාශ රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා යොදා ගෙන ඇත.

## දැක්ම

විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ අතීත පසුබිම විග්‍රහ කිරීමේ දී එහි දැක්ම වඩාත් හොඳින් විස්තර කල හැක්කේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හිටපු ජනාධිපතිනි ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය විජය කුමාරතුංග අරමුදලේ සභාපතිනිය ලෙසින් දක්වන ලද එතුමියගේම වදන් පෙළකිනි.

එනම් " මෙම ආරෝග්‍යශාලාව මගින් ප්‍රදේශයේ ජනතාව වෙත ඵලදායී සේවාවක් ලබා දිය යුතු වන්නාසේම කාර්‍ය්‍ය මණ්ඩලය ද ඉතා ඉහල කැපවීමක් සහිතව සේවය කල යුතු වන්නේය යන්නයි.එමෙන්ම විජය කුමාරතුංග අනුස්මරණ රෝහල දිවයිනේ අනිකුත් ආරෝග්‍යශාලා වෙත මග පෙන්වීමක් සිදුකරනු ලබන ආදර්ශමත් රෝහලක් ලෙස පවත්වාගෙන යා යුතු බැව්ද අප විසින් අනාවරණය කොට තිබේ.

## මෙහෙවර

කෙටි කාලාන්තරයක් තුළදී රෝහලේ දැනට සතුව ඇති සියළු පහසුකම් යොදා ගනිමින් ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතාවයන් සපුරාලමින් ඵලදායීව හා දැඩි කැපවීමෙන් යුක්තව සායනික සේවාවක් ඉටු කිරීම.දීර්ඝ කාලයක් තුලදී අක්ෂි විද්‍යාව හා සම්බන්ධ සෞඛ්‍ය පහසුකම් සැපයීමේ සේවාවක් මෙම ආරෝග්‍යශාලාව තුළ ව්‍යාප්ත කර ඇත.

දැනට රෝහලෙන් ලබා දිය හැකි උපරිම මට්ටමේ පහසුකම් සලකා බලමින් ප්‍රදේශයේ ජනතාව වෙත ඵලදායී හා ගුණාත්මක සේවාවක් සඳහා ඇප කැප වී ක්‍රියා කිරීම.

අක්ෂි විද්‍යාවට අමතර වශයෙන් ර්ට සමාන්තරව යමින් දියවැඩියා පාලන මධ්‍යස්ථානයක් ද දීර්ඝ කාලීන වශයෙන් ස්ථාපිත කොට මෙම සේවාවන් වැඩි දුරටත් ව්‍යාප්ත කිරීම.

## සාමූහික අභිමතාර්ථයන්

ආරෝග්‍යශාලාවේ අභිමතාර්ථයන් වන්නේ ප්‍රතිකාර සඳහා පැමිණෙන සාමාන්‍ය ජනතාවට කිසිදු වෙනසක් නොවන සේ ඵලදායී සෞඛ්‍ය ආරක්ෂණ සේවාවක් ලබා දීමයි.මෙහිදී අක්ෂි විද්‍යාත්මක සහ ශල්‍ය ප්‍රතිකාර ඉතා ඉහල ගුණාත්මක මට්ටමකින් ලබා දීමත් සමගම දියවැඩියා ප්‍රතිකාර සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් බවට මෙම රෝහල පත්කර ගැනිම තවත් අරමුණකි.

# ආශ්‍රිත තොරතුරු
# 2013.01.01 - 2013.12.31

සංවිධානයේ නම : විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

ලිපිනය : විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
සීදූව

කළමණාකරණය : අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.

නීතිගත කර ඇති ආකාරය : පාර්ලිමේන්තු පණතක් මගින් ස්ථාපිත කොට ඇත.

විගණන නිලධාරීන් : 01. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල

02. අභ්‍යන්තර විගණන ඒකකය
සෞඛ්‍ය අමාත්‍යාංශය, නො. 05 E, දෙවන මහල, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය, කොළඹ 01

## *අධ්‍යක්ෂ මණ්ඩලය*

- ✓ මහාචාර්ය කාලෝ ෆොන්සේකා - සභාපති
- ✓ වෛද්‍ය පාලිත මහීපාල, අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) - අධ්‍යක්ෂ
- ✓ එන්.ඒ. උමගිලිය මයා (වෘත්තීමය නියෝජිත) - අධ්‍යක්ෂ
- ✓ වෛද්‍ය පී.එස්. ජයලත් මිය (ආරෝග්‍යශාලා නියෝජිත) - අධ්‍යක්ෂ
- ✓ වෛද්‍ය විමුක්ති කුමාරතුංග (විජය කුමාරතුංග අනුස්මරණ රෝහල් පදනමේ සාමාජික) - අධ්‍යක්ෂ
- ✓ රුක්මාල් අබේවික්‍රම මිය (භාණ්ඩාගාර නියෝජිත) - අධ්‍යක්ෂ
- ✓ චන්ද්‍රා වික්‍රමසිංහ මයා - අධ්‍යක්ෂ

## *විගණන කමිටු*

- ✓ රුක්මාල් අබේවික්‍රම මිය (භාණ්ඩාගාර නියෝජිත) - සභාපති
- ✓ වෛද්‍ය පී. එස්. ජයලත් මිය (කාර්යභාර වෛද්‍ය නිලධාරිනී) - සාමාජික
- ✓ එම්.එම්.බී. කරුණාරත්න (ප්‍රධාන ගණකාධිකාරී) සෞඛ්‍ය අමාත්‍යාංශය - නිරීක්ෂක
- ✓ බී.පී.අයි. නිරංජා මිය (විගණන අධිකාරී) විගණකාධිපති දෙපාර්තමේන්තුව - නිරීක්ෂක
- ✓ එස්.ආර්.බී. ප්‍රනාන්දු මිය (ප්‍රධාන අභ්‍යන්තර විගණක) සෞඛ්‍ය අමාත්‍යාංශය - කැඳවුම්කරු
- ✓ කේ.එම්.වයි.කේ. කරුණාරත්න මිය (ගණකාධිකාරිණී) විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සහභාගි වන නිලධාරී

ගරු සෞඛ්‍ය අමාත්‍ය තුමා,

සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

ගරු අමාත්‍යතුමනි,

***<u>2013 ජනවාරි 01 දා සිට 2013 දෙසැම්බර් 31 වන දින දක්වා වන මුදල් වර්ෂය තුළ විජය කුමාරතුංග අනුස්මරණ රෝහල් මණ්ඩලයෙහි ගිණුම් ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව</u>***

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) වගන්තියට අනුව මා විසින් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ පාලක මණ්ඩලය වෙනුවෙන් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයට අදාල ගිණුම් ප්‍රකාශන හා වර්තා මේ සමඟ ඉදිරිපත් කරමි.

ස්තුතියි

මහාචාර්‍ය කාලෝ ෆොන්සේකා
සභාපති,
විජය කුමාරතුංග අනුස්මරණ රෝහල,
සීදූව.

පිටපත :- ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය

# මානව සම්පත් සංවර්ධනය

## ❖ 2013.12.31 දින වන විට කාර්ය මණ්ඩලය

1. විධායක කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| කාර්යභාර වෛද්‍ය නිලධාරී<br>විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී<br>ගණකාධිකාරී<br>පරිපාලන නිලධාරී | 04 |

2. විශේෂඥ වෛද්‍යවරු

| | | |
|---|---|---|
| a. ස්ථිර (අක්ෂි, කායික) | 02 | 08 |
| b. ස්ථිර කාර්ය මණ්ඩලයෙන් පිටත | 06 | |

| | |
|---|---|
| 3. වෛද්‍ය නිලධාරීන් | 16 |
| 4. දන්ත ශල්‍ය වෛද්‍ය | 01 |
| 5. ලියාපදිංචි වෛද්‍ය නිලධාරී | 02 |
| 6. අතුරු වෛද්‍ය කාර්ය මණ්ඩලය | 12 |
| 7. හෙද නිලධාරී | 44 |
| 8. ලිපිකරු ආශ්‍රිත ශ්‍රේණි | 05 |
| 9. ආහාර භාරකාරිණී | 01 |
| 10. ලේඛණාගාර සහකාර | 01 |
| 11. විදුලි කාර්මික | 01 |
| 12. අරක්කැමි | 02 |
| 13. නඩත්තු කම්කරු | 01 |
| 14. රියදුරු | 03 |
| 15. සුළු සේවක | 47 |
| 16. ආදේශක කම්කරු | 15 |

## ❖ 2013 වසර තුලදී සිදු කරන ලද බඳවා ගැනීම්

| | |
|---|---|
| 1. වෛද්‍ය නිලධාරී | 02 |
| 2. ගණකාධිකාරී | 01 |
| 3. රේඛණාගාර සහකාර | 01 |
| 4. ආහාර භාරකාරී | 01 |
| 5. හෙද නිලධාරී | 01 |
| 6. සුළු සේවක මණ්ඩල | 08 |

## නව හෙද නිලධාරි පත්වීම්

කඳාන හෙද පුහුණු විදුහලට අනුයුක්තව පුහුණුව අවසන් කළ පළමුව කණ්ඩායම 2014 ජනවාරි 01 දින සිට විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ ස්ථිර සේවයට බඳවා ගන්නා ලදී.

## සේවක පුහුණු කිරීම්

16 දෙනෙකු හෙද පුහුණුව සඳහා කඳාන හෙද පුහුණු පාසලට තේරී පත්වී ඇති අතර එම පුහුණුව 2013 කණ්ඩායම් 02 කින් ආරම්භ වීමට නියමිතව ඇත.

## අභ්‍යන්තර උසස් කිරීම්

අවශ්‍ය සුදුසුකම් වලින් යුතු සුළු සේවිකාවක ලේඛණාගාර සහකාර තනතුරට උසස් කිරීම.

## 2013 වර්ෂය තුළ ඉල්ලා අස්වීම් සහ සේවය අවසන් කිරීම්

- ගණකාධිකාරි 01 - වයස සම්පූර්ණ වීම හේතුවෙන් විශ්‍රාම ගැන්වීම
- ආහාර භාරකාරිණි 01 - පුද්ගලික හේතුන් මත ඉල්ලා අස් වීම
- සුළු සේවක 01 - පුද්ගලික හේතුන් මත ඉල්ලා අස් වීම

## 2013 වර්ෂය තුළ ස්ථාන මාරු වීම්

විජය කුමාරතුංග අනුස්මරණ රෝහලට නව පත්වීම් ලබා පැමිණි හෙද නිලධාරීනීන්ගෙන් වසර 03 ක සේවා කාලය සම්පූර්ණ කළ සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත හෙද නිලධාරීන් තිදෙනෙකු සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත නිදහස් කර හරින ලදී.

# 2013 වසර තුළ ලබා ගෙන ඇති ප්‍රධාන පෙලේ ජයග්‍රහණ

පහත සඳහන් මිලදී ගැනීම් 2013 වසරේ සිදු කර ඇත.

- වෛද්‍ය උපකරණ මිලදී ගැනීම් 2013 වසරේ සිදු කර ඇත. - රු. 14,505,000.00

| | |
|---|---|
| Fully Automated Bio Chemistry Analyzer | 8,736,000.00 |
| Fully Automated Hematology Analyzer | 2,500,000.00 |
| Cardiac Monitor | 750,000.00 |
| Defibrillator | 570,200.00 |
| Pulse Oxymeter | 135,500.00 |
| Major Spare Parts for Laser System | 1,098,600.00 |
| Vaporizer for Anesthetic Machine | 340,000.00 |
| Dental Item | 138,600.00 |
| Other Medical Item (BP Apparatus, Forceps ආදී) | 236,100.00 |

- ගෘහ භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම - රු. 363,800.00
- යන්ත්‍ර, කාර්යාලීය උපකරණ විදුලි උපකරණ මිලදී ගැනීම - රු. 571,200.00

| | |
|---|---|
| වායු සමීකරණ | 225,300.00 |
| පරිගණක යන්ත්‍ර | 104,300.00 |
| වෙනත් උපකරණ | 241,600.00 |

- සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් රු. 7,180,000.00 ක් වටිනා නවතම ගිලන් රථයක් රෝහලට ලැබීම.

- වාට්ටු අංක 01 සහ 02 තුළ ප්‍රතිකාර ලබන දීර්ඝකාලීන තුවාල සහිත රෝගීන් අනෙක් රෝගීන් හා සම්බන්ධ වීම වැළැක්වීම සඳහා වාට්ටු අංක 05 ලෙස වෙනම වාට්ටුවක් ස්ථාපිත කළ අතර එම වාට්ටුවේ වැසිකිළි පද්ධතිය නැවත ගැහැණු සහ පිරිමි ලෙස වෙන් කොට ඉදි කිරීම.
  වැය කරන ලද මුදල රු. 225,000.00

- රසායනාගාර පහසුකම් වර්ධනය කිරීම, දීර්ඝකාලීන තුවාල සහිත රෝගීන්ගේ ප්‍රතිකාර, සායන වැඩිදියුණු කිරීම ආදී කටයුතු සඳහා නව තෙමහල් ගොඩනැගිල්ල ඉදි කිරීම.
  ඇස්තමේන්තුගත පිරිවැය රු. 1,120,300.00

- රථගාල ඉදි කිරීම - පළමු අදියර ලෙස වාහන 16 නැවැත්වීමට ඉඩ සලසා දීම සඳහා රථගාල ඉදි කළ අතර එහි තවත් කොටසක් ලෙස තවත් වාහන 08 නවතා තැබීමට ඉඩ සලසා දෙමින් දෙවන කොටස ඉදි කිරීම.

- රෝහල පිටුපස වගුරු ඉඩමේ වර්ග අඩි 6,275 පස් පිරවීම
  දරණ ලද පිරිවැය රු. 803,000.00

- රෝහලේ සුළු සේවකයන්ගේ ශ්‍රමය යොදවාගෙන අක්ෂි සායන කොටසේ තීන්ත ආලේප කිරීම. මේ සඳහා වෙනත් පිරිවැයක් දරා නොමැත.

# ආරෝග්‍ය ශාලාවෙන් ලබා දෙන සේවා පිළිබඳ විශ්ලේෂණය

## ලබා දෙන සේවා පිළිබඳ සාරාංශය

රෝහල මගින් ලබා දෙන ප්‍රධාන සේවාවන් වන්නේ බාහිර රෝගී සත්කාර, හදිසි ප්‍රතිකාර ඒකකය මගින් ලබා දෙන සේවා, අක්ෂි ඒකකය මගින් ලබා දෙන සේවා, නේවාසික ප්‍රතිකාර සේවා, සාමාන්‍ය ශල්‍යකර්ම පහසුකම් සහ දීර්ඝකාලීන තුවාල පාලනය කිරීමේ ප්‍රතිකාර යනාදියය.

## සායන

ශල්‍ය සායන, ළමා සායන, දියවැඩියා සහ ආතතිය පිළිබඳ සායන, මනෝ වෛද්‍ය සායන, සුවනාරී සායන, පවුල් සැලසුම් සායන සතිපතා පවත්වා ගෙන යනු ලැබේ. වෛද්‍ය සායන, දන්ත සායන, අක්ෂි සායන දිනපතා පවත්නා ගෙන යනු ලැබේ.

වෛද්‍ය සායන, ශල්‍ය සායන, ළමා සායන සහ අක්ෂි සායන විශේෂඥ වෛද්‍යවරු යටතේ පාලනය වන අතර අනෙක් සියළු සායන පළපුරුදු වෛද්‍ය නිලධාරීන් යටතේ පවත්වා ගෙන යනු ලැබේ.

## සාමාන්‍ය රෝගීන් ඇතුළත් කර ගැනීම


බාහිර රෝගී අංශය, හදිසි ප්‍රතිකාර ඒකකය නැතහොත් සායන සඳහා රෝගීන්ට ඍජුවම යොමු විය හැක. වෛද්‍ය ගැටළු, ශල්‍ය වෛද්‍ය ගැටළු, ළමා සායන සම්බන්ධ ගැටළු සහ අනතුරු සහ අනතුරු නිසා ඇතිවන ශාරීරික තුවාල සහ එයින් හටගනු ලබන කම්පන තත්ත්වයන්ට ලක්වන රෝගීන් නේවාසික ප්‍රතිකාර සඳහා සහ අදාළ පරීක්ෂණ සඳහා යොමු කරනු ලබයි. කායික විශේෂඥ වෛද්‍යවරුන්ගේ ප්‍රතිකාර සහ පරීක්ෂණ අවශ්‍ය රෝගීන් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ MRI, CT Scan වැනි පරීක්ෂණ පහසුකම් නොමැති බැවින් උතුරු කොළඹ ශික්ෂණ රෝහල වෙත යොමු කරනු ලැබේ.

විශේෂඥ ප්‍රතිකාර අවශ්‍ය කරනු ලබන රෝගීන් වග කිවයුතු විශේෂඥ වෛද්‍යවරු සිටින අනෙකුත් රෝහල් වෙත යොමු කරන අතර අවශ්‍ය වූ විට ප්‍රතිකාර පවත්වා ගෙන යාම සඳහා නැවත විජය කුමාරතුංග අනුස්මරණ රෝහල වෙත යොමු කරනු ලැබේ. සංකූලතා සහිත රෝගීන්ගේ ප්‍රතිකාර සහ පරීක්ෂණ සඳහා විශේෂඥ වෛද්‍යවරු සිටින ලඟම රෝහල් වෙත මාරු කර හරිනු ලැබේ.

## *භාණ්ඩික විශ්ලේෂණය :-*

- ## බාහිර රෝගී ඒකකය

  - බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ලබා ගත් රෝගීන්ගේ දිනක සාමාන්‍ය 475 කි.
  - 2013 වසර තුළදී බාහිර රෝගී අංශයට ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණි රෝගීන් සංඛ්‍යාව 135,796 කි.





විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ බාහිර රෝගී අංශයෙන් ජා ඇල, සීදූව, කඳාන, කටුනායක, කුරණ, ඒකල සහ මීනුවන්ගොඩ ප්‍රදේශ වල සහ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ රෝගී වන ජනතාව ප්‍රතිකාර ලබා ගෙන ඇත.

මෙම වසරේදීත් ප්‍රමාණවත් වෛද්‍ය කාර්ය මණ්ඩලයක් නොසීටීම සීමාසහිත රෝගී සත්කාර සඳහා බලපාන බව හඳුනාගෙන ඇත.

- ## හදිසි ප්‍රතිකාර ඒකකය


  - පැය 24 කාලය ක්‍රියාත්මක වන සේවාවන් ලෙස ශල්‍ය වෛද්‍ය, ළමා රෝග සහ මාර්ග අනතුරු හේතුවෙන් ඇති වන හානි/ අනතුරු සහ අනෙකුත් අවස්ථවල ඇති වන අනතුරු සඳහාද මෙමගින් ප්‍රතිකාර කටයුතු සිදු කරනු ඇත. එමෙන්ම විශේෂඥ වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය රෝගීන් විශේෂඥ වෛද්‍යවරුන්ගේ ප්‍රතිකාර සඳහා ලඟම රෝහල් වලට මාරු කර යවනු ලබයි. මෙම ඒකකය මගින් සිදු කරන තවත් වැදගත් සේවයක් වන්නේ කායික රෝග විශේෂඥ වෛද්‍යවරයා පැමිණිදා පටන් නේවාසික වෛද්‍ය ප්‍රතිකාර ලබන දැඩි සත්කාර සහ පාලනය අවශ්‍ය රෝගීන්ගේ ප්‍රතිකාර කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය සහය ලබා දීම.

- 2013 වසර තුළදී හදිසි ප්‍රතිකාර ඒකකයට ප්‍රතිකාර ලබන ගැනීමට පැමිණි රෝගීන් ගණන 18,518 කි.




- **සායන**

- වෛද්‍ය සායන, ශල්‍ය සායන, ළමා රෝග සායන, දියවැඩියා සහ අධි රුධිර පීඩන සායන, අක්ෂි සායන, මානසික වෛද්‍ය සායන, සුවනාරී සායන, පවුල් සැලසුම් සායන පවත්වනු ලබයි.
- 2013 වසරේ සායන වලින් ප්‍රතිකාර ලබා ගත් රෝගීන් සංඛ්‍යාව 112,028 කි.




## ▪ දන්ත සායනය

- සාමාන්‍ය දන්ත ගැටළු සඳහා ප්‍රතිකාර දිනපතා සතියේ දිනවලදී සිදු කරනු ලබන අතර පාසල් දන්ත සායනය සෑම සෙනසුරාදා දිනයකදීම පවත්වනු ලබයි.

- දත් ඉගිල්ලීම, දත් පිරවීම, හදිසි අනතුරු වලදී ඇති වන දන්ත ගැටළු, විදුරු මස් සම්බන්ධ ගැටළු, දත් වල මැලියම් බැඳීමේ ගැටළු යන තත්ත්වයන්ට මෙම සායනය තුළදී ප්‍රතිකාර කරනු ලබයි. සාමාන්‍යයෙන් පිළිපැදිය යුතු දන්ත වෛද්‍ය උපදෙස් ලබා දීම සහ මුඛය ආශ්‍රිතව සිදු කරනු ලබන හකු ප්‍රදේශයේ මතුවන දත් ගැලවීම, රදනක දත් ඉවත් කිරීම යන ප්‍රතිකර්මද මෙම සායනය තුළදී සිදු කරනු ලබයි.


| | |
|---|---|
| මුළු දත් ඉගිල්ලවීම් ප්‍රමාණය | 3,445 |
| මුළු ස්ථිර පිරවීම් සහ තාවකාලික පිරවීම් ගණන | 2,048 |
| මුඛය ආශ්‍රිත වෙනත් රෝග සඳහා පැමිණි රෝගීන් ගණන | 2,818 |
| දන්ත සායනය සඳහා පැමිණි මුළු රෝගීන් ගණන | 8,311 |




මුඛයේ අලංකාරය වැඩි කිරීම සඳහා යොදා ගන්නා දන්ත වැඩසටහන්ද සායනය තුළ සිදු කරනු ලැබේ. සුදු වර්ණය යොදාගෙන සිදු කරනු ලබන පිරවීම් ඉදිරි දත් සඳහා Composite පිරවීම සහ පසුපස දත් සඳහා GIC පිරවීම මෙහිදී සිදු කරනු ලබයි.


## ▪ අභ්‍යන්තර රෝගීන්

- ඇඳන් 164 කින් යුක්ත වාට්ටු 05 ක් ඇති අතර අක්ෂි ඒකකය සඳහා ඇඳන් 88 ක් වෙන් කර ඇත.
- 2013 වර්ෂයේ අභ්‍යන්තරව ප්‍රතිකාර ගත් රෝගීන් ගණන 15,963 කි.




## ▪ සිදු කර ඇති ශල්‍යකර්ම

- කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෘත්තීය ඒකකයට අයත් වෛද්‍ය නිලධාරීන්ගේ උපකරණ සහිතව මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ ශල්‍යකර්ම සිදු කිරීම.
- 2013 වර්ෂයේ සිදු කරන ලද ශල්‍යකර්ම ප්‍රමාණය (අක්ෂි සහ සාමාන්‍ය ශල්‍යකර්ම) 12,879 කි.
- රෝහල මගින් අනුමත කළ මිල ගණන් සියළුම ශල්‍යකර්ම වලට අදාළ වේ. අඩු ආදායම්ලාභී රෝගීන්ට මෙම රෝහල් ගාස්තුවලින් නිදහස් කිරීමට වැඩපිළිවෙල යොදා ඇත.




## ▪ තුවාල සත්කාර ඒකකය

- තුවාල සත්කාර ඒකකය දිනපතා පවත්වන්නා වූ සායනයකි. ඇඳන් 22කින් යුත් එක් වාට්ටුවක් මේ සඳහා වෙන් කර ඇත.
- තුවාල සත්කාර ඒකකය සම්බන්ධ සේවාවල විශිෂ්ඨ වර්ධනයක් මෙම වර්ෂයේ සිදු වී ඇත. පිට පළාත්වල රෝගීන් විශාල ප්‍රමාණයක් මෙම තුවාල සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝහල වෙත යොමුවී ඇත.

2013 වර්ෂයට අදාළ සංඛ්‍යා දත්ත පහත පරිදි වේ.


1. සායනයට සහභාගි වූ නව රෝගීන් සංඛ්‍යාව - 376
2. සායනයට සහභාගි වූ මුළු රෝගීන් සංඛ්‍යාව - 6,069
3. පිටව ගිය රෝගීන් සංඛ්‍යාව - 150
4. දියවැඩියා තුවාල - 25%
5. No. of Arterial wounds treated - 5%
6. No. of Venous wounds treated - 25%
7. No. of mix pathological wounds treated - 44%
8. No. of Surgical wounds treated - 1%

- නිර්වින්දනය කර ශල්‍යකර්ම සිදු කළ යුතු රෝගීන් විශේෂඥ වෛද්‍යවරු යටතේ පාලනය වන ළඟම ඇති උතුරු කොළඹ ශික්ෂණ රෝහල සහ මීගමුව රෝහල් වෙත යොමු කරන අතර එම ප්‍රතිකාර අවසන් වූ වහාම නැවත ප්‍රතිකාර අඛණ්ඩව කර ගෙන යාම සඳහා විජය කුමාරතුංග අනුස්මරණ රෝහලට යොමු කරනු ලබයි.




## ▪ රසායනාගාර පර්යේෂණ

- මූලිකව රසායනාගාර සේවා සපයනු ලබයි.
- 2013 වසරේ සිදු කරන ලද මුළු රසායනාගාර පර්යේෂණ සංඛ්‍යාව 34,082 කි.





## ▪ විද්‍යුත් තන්තු රේඛණය

- 2013 දී සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව 3,005 කි.



- **X – කිරණ පරීක්ෂණ**

  - 2013 වසරේ සිදු කරන ලද X – කිරණ පරීක්ෂණ සංඛ්‍යාව 3,424 කි.



# අක්ෂි ඒකකය

අක්ෂි ඒකකය මගින් සපයනු ලබන සේවාවන් වන්නේ දෛනික සායන, පැය 24 තුළම ක්‍රියාත්මක හදිසි ප්‍රතිකාර සේවාවන් අක්ෂි සම්බන්ධ පරීක්ෂණ, අක්ෂි ශල්‍යකර්ම, ලේසර් ප්‍රතිකාර, අභ්‍යන්තර අක්ෂි රෝගී ප්‍රතිකාර සහ අක්ෂි කඳවුරු පැවැත්වීම යනාදියය.

අක්ෂි ඒකකය මගින් සපයනු ලබන සේවා වල සාරාංශය

| සේවාව | 2013 වර්ෂයේ සිදු කළ ප්‍රමාණය |
|---|---|
| රෝගී ඇතුලත්වීම් ගණන | 12,830 |
| ශල්‍යකර්ම සංඛ්‍යාව | 10,247 |
| සායනවලට පැමිණි රෝගීන් සංඛ්‍යාව | 65,642 |
| ලේසර් ප්‍රතිකාර ලබා ගත් රෝගීන් සංඛ්‍යාව | 2,228 |
| කණ්ණාඩි සඳහා ප්‍රතිකාර ලබා ගත් සංඛ්‍යාව | 22,104 |
| හදිසි රෝග සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව | 2,235 |
| අක්ෂි කඳවුරු සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව | 3,000 |

## 1. සායන

- මෙම සායන සතියේ ඉරිදා සහ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින හැර අන් සියළු දිනවල පවත්වනු ලැබේ.
- කලින් වෙන් කර ගැනීමක් අවශ්‍ය නොවන අතර රෝගීන්ට සෘජුවම සායනයට පැමිණි රෝග පරීක්ෂා කර ගත හැක.
- රෝගීන් සීමා කිරීමක් නැත.
- පහත සඳහන් සායන පවත්වනු ලැබේ.

  - සාමාන්‍ය අක්ෂි සායනය
  - දියවැඩියා රෝගීන්ගේ සායනය
  - ග්ලූකෝමා තත්ත්වයන්ට පත් රෝගී සායනය
  - ළමා සායනය
  - පශ්චාත් සායන

## 2. අක්ෂි ශල්‍යකර්ම

පහත සඳහන් වර්ගයේ අක්ෂි ශල්‍යකර්ම මෙම ඒකකය මගින් සිදු කරනු ලැබේ.

1) ඉදිරිපස කොටසේ ශල්‍යකර්ම
2) දෘෂ්ඨි විතානය යාබද පසුභාගයේ සැත්කම්
3) අක්ෂි කුහර ආශ්‍රිත සැත්කම්
4) ග්ලූකෝමා ආශ්‍රිත සැත්කම්
5) ඇස් බාහිරව සිදු කරනු ලබන සැත්කම්

එක් දින ශල්‍යකර්මයක් ලෙස පවත්වනු ලබන ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්ම සඳහා ඉතා කෙටිකාලීන පොරොත්තු ලේඛණයක් මෙම ඒකකය මගින් පවත්වා ගෙන යනු ලබන අතර අවශ්‍ය සියළු රෝගීන්ගේ ශල්‍යකර්ම ඇතුල් වී එදිනම සිදු කරනු ලැබේ. (ඇසේ සුද නිසා අන්ධභාවයට පත් විය හැකි රෝගීන්ගේ ශල්‍යකර්ම)

**කරන ලද ශල්‍යකර්ම**

| ශල්‍යකර්ම වර්ගය | 2013 ශල්‍යකර්මයට භාජනය වූ රෝගීන් සංඛ්‍යාව |
|---|---|
| ඉදිරිපස කොටසේ ශල්‍යකර්ම | 9,108 |
| දියවැඩියා ශල්‍යකර්ම | 113 |
| දෘෂ්ඨි විතානය ආශ්‍රිත ශල්‍යකර්ම | 297 |
| වෙනත් ශල්‍යකර්ම | 729 |
| සායනය තුළ සිදු කළ සුළු ශල්‍යකර්ම | 263 |
| **මුළු සංඛ්‍යාව** | **10,510** |

## 3. ලේසර් ප්‍රතිකාර

පහත දැක්වෙන වර්ගයේ සියළුම ලේසර් ප්‍රතිකාර සිදු කර ඇත.

1) Yag Capsulotomy
2) Yag PI
3) Pan Retinal Laser Photo Coagulation (PRP)
4) Focal Laser Treatment (FLT)

විශාල වර්ගයේ දියවැඩියා හා ග්ලූකෝමා තත්ත්ව පාලනය සඳහා මෙම ලේසර් ප්‍රතිකාර යොදා ගනු ලැබේ.

බොහෝ රෝගීන් පිරිසකට සායනය සඳහා පැමිණි දිනයේදීම ලේසර් ප්‍රතිකාර සඳහා යොමු වීමට ඉඩ සලසා ඇත.

**2013 වර්ෂයේ සිදු කළ ලේසර් ප්‍රතිකාර ප්‍රමාණය**

| ලේසර් ප්‍රතිකාර වර්ගය | සිදු කළ ප්‍රමාණය |
|---|---|
| PRP | 330 |
| FLT | 304 |
| YAG Capsulotomy | 1,099 |
| Yag PI | 130 |
| Other | 365 |
| **මුළු සංඛ්‍යාව** | **2,228** |

## 4. රෝහල් ගත කළ රෝගීන් කළමනාකරණය

අක්ෂි වාට්ටුව ඇඳන් 88 කින් සමන්විත වන අතර දිනකට මෙහිදී අක්ෂි ශල්‍යකර්ම විශාල ප්‍රමාණයක් සිදු කරනු ලබයි. එනිසා පවතින ඇඳන් සංඛ්‍යාවෙහි හිඟයක් පැවතියද එය දුර්වල අන්දමින් රෝහල් කටයුතු වලදී බලපා නොමැත.
රෝහල් ගත කළ රෝගීන් සංඛ්‍යාව 12,830

## 5. දෘෂ්ඨි ඌණතා ආශ්‍රිත සේවා

| | |
|---|---|
| ඇස් කණ්නාඩි සේවා | 22,104 |
| H.V.F. Patients | 205 |
| P.M.T. Patients | 3,380 |
| Post Operative Patients | 1,397 |

## 6. අක්ෂි කඳවුරු

අක්ෂි කඳවුරු මගින් දිවයින පුරා විසිර සිටින අක්ෂි ශල්‍යකර්ම අවශ්‍ය රෝගීන් හඳුනාගෙන ඔවුන්ව අක්ෂි ශල්‍යකර්ම, ලේසර් ප්‍රතිකාර යනාදිය සඳහා විජය කුමාරතුංග රෝහලට යොමු කරනු ලැබේ.
අක්ෂි කාච ලබා ගත නොහැකි රෝගීන්ට එම කාච නොමිලේ ලබා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ Vision 2020 ආයතනය මෙම රෝහලට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

2013 වර්ෂයේ පවත්වන ලද අක්ෂි කඳවුරු

| දිනය | අක්ෂි කඳවුර | අනාවරණය කර ගත් රෝගීන් ප්‍රමාණය |
|---|---|---|
| 2013/03/06 | කැළණිය සෞ.වෛ.නි. | 500 |
| 2013/06/17 | සූරියවැව | 1000 |
| 2013/09/10 | සූරියවැව | 1000 |
| 2013/10/06 | හුණුපිටිය | 500 |

## 07. අක්ෂි රෝග සම්බන්ධ පර්යේෂණ

අක්ෂි රෝග නිධානයක් සොයා ගැනීම සඳහා පහත සඳහන් පරීක්ෂණ පහසුකම් සලසා ඇත.

1. Fundus fluorescein angiography
2. Anterior segment photography
3. HVF ( Humphrey visual field )
4. A scan / contact biometry
5. B scan
6. OCT ( Optical Coheracne Tomography )

## ❖ පර්යේෂණ සහ ප්‍රසිද්ධ කිරීම්

වෛද්‍ය කාර්ය මණ්ඩලය විසින් විවිධ පර්යේෂණ ව්‍යාපෘති ඉදිරිපත් කර සහ ප්‍රසිද්ධියට පත්කර ඇත.

1) ශ්‍රී ලංකාවේ දියවැඩියා තත්ත්වයෙන් මිදීමට කෙතරම් කාලයක් ගතවේද.
2) වැඩිහිටියන් අතර ඇසේ සුද ඇති වීම පැතිරීමේ ප්‍රවණතාවය

✓ **2013 වර්ෂය තුළ ඇඳන් භාවිතා කිරීමේ අනුපාතය - 72.44%**

✓ **2013 වර්ෂය තුළදී දකින ලද රෝගී තත්ත්වයන් :-**

ඇතුළත් කරන ලද රෝගීන් ඔවුන්ගේ රෝගී තත්ත්වයන් අනුව පෙළගැස්වූ විට,

1) ඇසේ සුද සහ අනෙකුත් රෝග තත්ත්වයන්
2) වෛරස් රෝග/ වෛරස් උණ ඇතුළත්ව
3) ශ්වසන නාල ආසාදන
4) අධි රුධිර පීඩනය
5) සම සහ සම ආශ්‍රිත රෝග
6) ආමාශයේ තීව්‍ර දැවිල්ල
7) ජඨරදාහය

✓ **විශේෂ සිද්ධි**

- 2013 පෙබරවාරි 15 දින වාර්ෂික ලේ දන් දීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.
- අංශ ප්‍රධානීන්ගේ රැස්වීම් නිරන්තරව පවත්වන ලද අතර එදිනෙදා ගැටළු ද සාකච්ඡා කරනු ලැබේ.
- අවශ්‍ය යැයි සැලකෙන සෑම මොහොතකම කාර්ය මණ්ඩල රැස්වීම් පවත්වන ලදී.

✓ **වෙනත් අවධානය යොමු විය යුතු කරුණු**

- කිසිදු ආකාරයක විශාල ප්‍රමාණයේ ඖෂධ හෝ වෙනත් පරිභෝජන ද්‍රව්‍ය වල හිඟයක් නොපැවතීම.
- කිසිදු ආකාරයක වැඩ වර්ජන නොපැවතීම.
- රෝහලට හෝ එහි කාර්ය මණ්ඩලයට විරුද්ධව කරනු ලැබූ කිසිදු ආකාරයක පැමිණිලි නොමැති වීම.

## සපයන ලද සේවාවන් - 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා

| සපයන ලද සේවාව | | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බාහිර රෝගී අංශය | (රෝගීන් සංඛ්‍යාව) | 10,223 | 11,066 | 11,179 | 10,076 | 12,658 | 12,844 | 12,666 | 10,389 | 10,075 | 11,583 | 11,647 | 11,390 | **135,796** |
| හදිසි ප්‍රතිකාර අංශය | (රෝගීන් සංඛ්‍යාව) | 1,571 | 1,484 | 1,704 | 1,563 | 1,683 | 1,674 | 1,534 | 1,423 | 1,348 | 1,412 | 1,443 | 1,679 | **18,518** |
| සායන | | | | | | | | | | | | | | |
| අක්ෂි I | (රෝගීන් සංඛ්‍යාව) | 930 | 1,017 | 941 | 1,085 | 883 | 1,125 | 1,125 | 965 | 1,098 | 1,041 | 926 | 1,139 | **12,275** |
| අක්ෂි II | (රෝගීන් සංඛ්‍යාව) | 3,950 | 3,542 | 5,088 | 3,704 | 3,953 | 3,841 | 4,867 | 5,488 | 4,589 | 4,966 | 4,641 | 4,738 | **53,367** |
| දන්ත | (ප්‍රතිකාර සංඛ්‍යාව) | 773 | 664 | 729 | 552 | 681 | 701 | 752 | 765 | 787 | 538 | 688 | 681 | **8,311** |
| වෛද්‍ය | (රෝගීන් සංඛ්‍යාව) | 1,741 | 1,685 | 2,143 | 1,690 | 1,978 | 1,947 | 1,805 | 1,996 | 1,949 | 1,803 | 2,288 | 1,751 | **22,776** |
| දියවැඩියා | | | | | | | | | | | | | | |
| අධි රුධිර පීඩනය | (රෝගීන් සංඛ්‍යාව) | 152 | 106 | 141 | 121 | 136 | 152 | 182 | 141 | 137 | 168 | 159 | 123 | **1,718** |
| ශල්‍ය | (රෝගීන් සංඛ්‍යාව) | 124 | 109 | 138 | 68 | 129 | 111 | 91 | 81 | 75 | 92 | 102 | 25 | **1,145** |
| ළමා | (රෝගීන් සංඛ්‍යාව) | 184 | 210 | 168 | 177 | 151 | 130 | 184 | 115 | 125 | 198 | 162 | 123 | **1,927** |
| මානසික රෝග | (රෝගීන් සංඛ්‍යාව) | 184 | 112 | 149 | 165 | 133 | 152 | 197 | 150 | 200 | 166 | 202 | 204 | **2,014** |
| පවුල් සංවිධාන | (රෝගීන් සංඛ්‍යාව) | 3 | 10 | 9 | 2 | 13 | 16 | 10 | 18 | 11 | 14 | 17 | 9 | **132** |
| සුවනාරි සායනය | (රෝගීන් සංඛ්‍යාව) | 19 | 11 | 23 | 19 | 8 | 11 | 20 | 13 | 33 | 23 | 20 | 8 | **208** |
| තුවාල සත්කාර ඒකකය | (රෝගීන් සංඛ්‍යාව) | 394 | 377 | 434 | 484 | 492 | 458 | 528 | 513 | 583 | 617 | 611 | 578 | **6,069** |
| අභ්‍යන්තර රෝගීන් | | | | | | | | | | | | | | **-** |
| 01 වාට්ටුව | (ඇතුළත් කිරීම් සංඛ්‍යාව) | 107 | 94 | 99 | 114 | 129 | 135 | 114 | 88 | 90 | 104 | 122 | 124 | **1,320** |
| 02 වාට්ටුව | (ඇතුළත් කිරීම් සංඛ්‍යාව) | 134 | 107 | 155 | 128 | 160 | 160 | 161 | 128 | 109 | 136 | 118 | 172 | **1,668** |
| 03 වාට්ටුව | (ඇතුළත් කිරීම් සංඛ්‍යාව) | 367 | 424 | 449 | 307 | 499 | 398 | 560 | 431 | 499 | 429 | 408 | 372 | **5,143** |
| 04 වාට්ටුව | (ඇතුළත් කිරීම් සංඛ්‍යාව) | 576 | 622 | 696 | 438 | 693 | 645 | 815 | 691 | 693 | 665 | 526 | 627 | **7,687** |
| 05 වාට්ටුව | (ඇතුළත් කිරීම් සංඛ්‍යාව) | 17 | 10 | 15 | 13 | 18 | 11 | 10 | 11 | 15 | 10 | 9 | 6 | **145** |
| ශල්‍යකර්ම | | | | | | | | | | | | | | |
| අකෂි ශල්‍යකර්ම ගණන | | 658 | 739 | 918 | 562 | 923 | 865 | 1,131 | 895 | 966 | 988 | 787 | 815 | **10,247** |
| සුළු අක්ෂි ශල්‍යකර්ම (සායනය තුළ) | | 5 | 22 | 24 | 14 | 11 | 26 | 23 | 30 | 26 | 18 | 46 | 18 | **263** |
| සාමාන්‍ය ශල්‍යකර්ම | (ශල්‍යකර්ම සංඛ්‍යාව) | 11 | 9 | 15 | 13 | 17 | 11 | 10 | 11 | 15 | 10 | 10 | 9 | **141** |
| ලේසර් ප්‍රතිකාර | (ශල්‍යකර්ම සංඛ්‍යාව) | 40 | 82 | 132 | 106 | 129 | 190 | 313 | 341 | 228 | 230 | 260 | 177 | **2,228** |
| ඇස් කණ්නාඩි පරීක්ෂණ | (පරීක්ෂණ සංඛ්‍යාව) | 1,364 | 1,200 | 1,348 | 959 | 1,355 | 1,528 | 1,551 | 1,662 | 1,434 | 1,416 | 1,420 | 1,225 | **16,462** |
| HVF පරීක්ෂණ | (පරීක්ෂණ සංඛ්‍යාව) | 34 | 17 | 16 | 18 | 4 | 21 | 35 | 10 | 9 | 27 | 33 | 35 | **259** |
| රසායනාගාරය | (පරීක්ෂණ සංඛ්‍යාව) | 2,861 | 2,603 | 2,519 | 2,424 | 2,446 | 2,280 | 2,287 | 2,890 | 3,300 | 4,043 | 3,472 | 2,957 | **34,082** |
| එක්ස් කිරණ | (එක්ස් රේ සංඛ්‍යාව) | 260 | 276 | 287 | 94 | 236 | 291 | 303 | 319 | 327 | 300 | 377 | 354 | **3,424** |
| ඊ.සී.ජී. | (රෝගීන් සංඛ්‍යාව) | 258 | 157 | 245 | 183 | 243 | 210 | 218 | 247 | 132 | 254 | 381 | 477 | **3,005** |

# විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදූව

# මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය

## 2013 දෙසැම්බර් 31 දිනට

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 1 | 11,511,170.58 | 2,969,439.05 |
| ලැබිය යුතු දෑ | 2 | 6,050,503.00 | 4,253,992.00 |
| තොග | 3 | 8,820,904.50 | 9,753,250.06 |
| කලින් ගෙවීම් | 4 | 598,022.24 | 277,738.97 |
| | | 26,980,600.32 | 17,254,420.08 |
| කෙරෙමින් පවතින මූලධන වියදම් | 5 | 2,241,934.00 | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| යටිතල පිරියත හා උපකරණ | 6 | 48,191,394.25 | 40,407,506.74 |
| ඉඩම් හා ගොඩනැගිලි | 7 | 153,579,584.79 | 155,296,482.60 |
| | | 201,770,979.04 | 195,703,989.34 |
| **මුළු වත්කම්** | | 230,993,513.36 | 212,958,409.42 |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | | |
| ගෙවිය යුතු දෑ | 8 | 16,034,021.44 | 12,000,078.98 |
| කෙටිකාලීන ණය | 9 | 20,724,091.46 | 7,302,547.44 |
| සේවක ප්‍රතිලාභ | 10 | 17,616,699.70 | 13,109,865.91 |
| මුළු බැරකම් | | 54,374,812.60 | 32,412,492.33 |
| ශුද්ධ වත්කම් | | **176,618,700.76** | **180,545,917.09** |

**ශුද්ධ වත්කම් / ස්කන්ධය**

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 11 | 75,787,890.44 | 75,787,890.44 |
| රජයේ ප්‍රධාන - මූලධන | 12 | 131,531,083.25 | 114,826,665.05 |
| පරිත්‍යාග | | 461,894.60 | 218,844.60 |
| ලැබීම් - ප්‍රාග්ධන ඉපයීම් | | 2,131,366.30 | 2,131,366.60 |
| සමුච්චිත අතිරික්තය/ ඌණතාවය | 13 | (33,293,533.83) | (12,418,849.30) |
| **මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | **176,618,700.76** | **180,545,917.09** |

මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳී සිටින අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

……………………………………..

**සභාපති**

දිනය :

……………………………………..

**අධ්‍යක්ෂ**

දිනය :

……………………………………..

**අධ්‍යක්ෂ**

දිනය :

……………………………………..

**ගණකාධිකාරිණී**

දිනය :

# විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදූව
# මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
# 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **අයභාරය** | | | |
| රජයේ ප්‍රදාන (පුනරාවර්ථන) | | 120,250,000.00 | 128,070,000.00 |
| රජයේ මූලධන ප්‍රදාන වලට අදාළ ක්‍රමක්ෂය | | 17,525,581.80 | 15,817,907.36 |
| වෙනත් අයභාර | 14 | 16,534,203.60 | 10,545,200.80 |
| මුළු අයභාර | | 154,309,785.40 | 154,433,108.16 |
| **වියදම්** | | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | 15 | 90,863,190.23 | 80,659,607.32 |
| සැපයුම් හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 16 | 37,361,818.72 | 29,115,286.41 |
| ක්ෂය | 17 | 17,546,479.30 | 16,944,082.36 |
| වෙනත් වියදම් | 18 | 27,481,236.35 | 24,067,261.61 |
| **මුළු වියදම්** | | **173,252,724.60** | **150,786,237.70** |
| **කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය (ඌණතාවය)** | | **(18,942,939.20)** | **3,646,870.46** |

# විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදූව
# 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2013<br>රු. |
|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්** | |
| අතිරික්තය / ඌණතාවය | (18,942,939.20) |
| **මුදල් නොවන වෙනස්වීම්** | |
| ක්ෂයවීම් | 17,546,479.30 |
| ක්‍රමක්ෂය | (17,525,581.80) |
| ගෙවීම්වල වැඩිවීම | 17,455,486.48 |
| තොග වල අඩුවීම | 932,345.56 |
| සේවක වියදම් සඳහා වෙන් කිරීම්වල වැඩිවීම | 4,906,904.56 |
| කලින් ගෙවීම්වල වැඩිවීම | (320,283.27) |
| ලැබීම්වල වැඩිවීම | (1,796,511.00) |
| පෙර වර්ෂ ගැලපීම් | (799,980.33) |
| විශ්‍රාම ගැනීමට අදාළ ප්‍රතිලාභ ගෙවීම් | (400,070.77) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,055,849.53** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්** | |
| පිරියත හා උපකරණ මිලදී ගැනීම | (17,422,184.00) |
| කෙරෙමින් පවතින කටයුතු (මූලධන) | (2,241,934.00) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ ප්‍රවාහය** | **(19,664,118.00)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්** | |
| රජයේ ප්‍රධාන (මූලධන) | 27,050,000.00 |
| පරිත්‍යාග වශයෙන් ලැබූ මුදල් | 100,000.00 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **27,150,000.00** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම / අඩු වීම** | **8,541,731.53** |
| **කාලපරිච්ජේදය ආරම්භයේවූ මුදල් හා මුදල් සමාන දෑ** | **2,969,439.05** |
| **කාලපරිච්ජේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ** | **11,511,170.58** |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට සටහන්**

| | 2013 |
|---|---|
| බැංකු වල ඇති මුදල් | 11,485,620.58 |
| සුළු මුදල් | 25,000.00 |
| අතැති මුදල් | 550.00 |
| | **11,511,170.58** |

## විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදූව
## ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය
## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | භාණ්ඩාගාර පරිත්‍යාග<br>රු. | රජයේ ප්‍රධාන මූලධන<br>රු. | වෙනත් ආයතන පරිත්‍යාග<br>රු. | විජය කුමාරතුංග අනුස්මරණ පදනම<br>රු. | ආයෝජන මණ්ඩලය<br>රු. | නාගරික සංවර්ධන අධිකාරිය<br>රු. | ප්‍රාග්ධන ඉපයීම්<br>රු. | ශුද්ධ ලාභ/ අලාභ<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 5,600,000 | 109,226,665 | 218,845 | 29,632,139 | 28,155,751 | 18,000,000 | 2,131,366 | (12,418,849) | 180,545,917 |
| වර්ෂය තුළ වූ පරිත්‍යාග | 7,180,000 | | 243,050 | | | | | | 7,423,050 |
| වර්ෂය තුළ රජයේ ප්‍රධාන - මූලධන | | 27,050,000 | | | | | | | 27,050,000 |
| මූලධන ප්‍රධාන ක්‍රමක්ෂය | | (17,525,582) | | | | | | | (17,525,582) |
| කාලපරිච්ජේදය සඳහා වූ අතිරික්තය/ ඌණතාවය | | | | | | | | (18,942,939) | (18,942,939) |
| පෙර වර්ෂයට අදාළ ගැලපීම් | | | | | | | | (1,931,745) | (1,931,745) |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 12,780,000 | 118,751,083 | 461,895 | 29,632,139 | 28,155,751 | 18,000,000 | 2,131,366 | (33,293,533) | 176,618,701 |

# විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදූව

# 2013 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛණය

| අයිතමය | පිරිවැය | | | | අනුපාතය | ක්ෂය | | | | 2013.12.31 දිනට ලියාහළ අගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2013.01.01 දිනට ශේෂය | කාලපරිච්ජේදය තුළ එකතුවීම් | කාලපරිච්ජේදය තුළ ඉවත්කිරීම් | 2013.12.31 දිනට ශේෂය | | 2013.01.01 දිනට ශේෂය | කාලපරිච්ජේදය තුළ එකතුවීම් | කාලපරිච්ජේදය තුළ ඉවත්කිරීම් | 2013.12.31 දිනට ශේෂය | |
| ඉඩම් | 18,627,500.00 | | - | 18,627,500.00 | | - | | | - | 18,627,500.00 |
| ගොඩනැගිලි | 156,482,447.74 | 2,023,277.00 | (604,229.50) | 157,901,495.24 | 2% | 19,813,465.14 | 3,158,029.90 | 22,084.59 | 22,949,410.45 | 134,952,084.79 |
| වාහන | 10,778,792.90 | 7,180,000.00 | | 17,958,792.90 | 20% | 5,618,789.90 | 3,006,000.00 | | 8,624,789.90 | 9,334,003.00 |
| ගෘහභාණ්ඩ හා උපකරණ | 8,292,967.77 | 363,579.20 | | 8,656,546.97 | 10% | 6,235,572.22 | 484,038.70 | | 6,719,610.92 | 1,936,936.05 |
| යන්ත්‍ර | 6,144,323.73 | 473,472.80 | | 6,617,796.53 | 15% | 4,796,071.14 | 394,387.20 | | 5,190,458.34 | 1,427,338.19 |
| පරිගණක | 541,145.00 | 104,250.00 | | 645,395.00 | 20% | 452,938.00 | 54,900.00 | | 507,838.00 | 137,557.00 |
| වෛද්‍ය උපකරණ | 104,220,512.64 | 14,600,655.01 | (1,822,731.00) | 116,998,436.65 | 15% | 72,466,864.04 | 10,449,123.50 | 1,273,110.90 | 81,642,876.64 | 35,355,560.01 |
| | 305,087,689.78 | 24,745,234.01 | (2,426,960.50) | 327,405,963.29 | | 109,383,700.44 | 17,546,479.30 | 1,295,195.49 | 125,634,984.25 | 201,770,979.04 |

**201,770,979.04**

| | | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| **මුදල් සහ මුදල් සමාන දෑ** | **01** | | |
| බැංකුවල ඇති මුදල් | | 11,485,620.58 | 2,943,589.05 |
| සුළු මුදල් | | 25,000.00 | 25,000.00 |
| අතැති මුදල් | | 550.00 | 850.00 |
| | | 11,511,170.58 | 2,969,439.05 |

| | | | |
|---|---|---|---|
| **ලැබිය යුතු දෑ** | **02** | | |
| තැන්පත් ගිණුම | | 50,000.00 | 50,000.00 |
| උත්සව අත්තිකාරම් | | 237,500.00 | 235,000.00 |
| විශේෂ අත්තිකාරම් | | 750.00 | 750.00 |
| අත්තිකාරම් | | | 35,000.00 |
| ආපදා ණය | | 5,762,253.00 | 3,933,242.00 |
| | | 6,050,503.00 | 4,253,992.00 |

| | | | |
|---|---|---|---|
| **තොග** | **03** | | |
| ලිපිද්‍රව්‍ය | | 90,561.71 | 145,338.30 |
| ඖෂධ | | 7,498,661.48 | 8,802,211.14 |
| රසායනාගාර රසායනික ද්‍රව්‍ය | | 598,611.27 | 201,876.66 |
| රෙදිපිළි | | 269,615.10 | 261,635.64 |
| පොදු ගබඩා භාණ්ඩ | | 195,027.96 | 216,503.34 |
| නඩත්තු සහ අළුත්වැඩියා | | 94,557.74 | 125,684.98 |
| X කිරණ පටල | | 73,869.24 | |
| | | 8,820,904.50 | 9,753,250.06 |

| | | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| **කලින් ගෙවීම්** | **04** | | |
| රක්ෂණ - මුදල් හා සංක්‍රමණික | | 6,095.30 | 6,244.55 |
| රක්ෂණ - කැබ් රථය GD 2714 | | 3,307.67 | 3,749.86 |
| රක්ෂණ - කැබ් රථය PC 4087 | | 54,434.81 | 50,630.80 |
| රක්ෂණ - ගිලන්රථය HN-6312 | | 38,575.34 | |
| සේවා ගිවිසුම - ඡායා පිටපත් යන්ත්‍රය | | 8,123.56 | 7,366.08 |
| ආදායම් බලපත්‍රය GD 2714 | | 9,808.70 | 7,842.20 |
| ආදායම් බලපත්‍රය PC 4087 | | 6,160.62 | 3,912.00 |
| සේවා ගිවිසුම - ලීජි ආයතනය | | 111,097.08 | 76,930.89 |
| සේවා ගිවිසුම - ෆැක්ස් යන්ත්‍රය | | | 5,442.46 |
| සේවා ගිවිසුම - විදුලි සෝපානය | | 120,419.16 | 106,953.43 |
| සේවා ගිවිසුම - පරිගණක යන්ත්‍ර | | | 8,666.70 |
| කුලී ගිවිසුම | | 240,000.00 | |
| | | 598,022.24 | 277,738.97 |
| **මූලධන - කෙරෙමින් පවතින වැඩ** | **05** | | |
| කෙරෙමින් පවතින වැඩ - නව ගොඩනැගිල්ල | | 1,120,320.00 | |
| කෙරෙමින් පවතින වැඩ - දෙවන රථගාල | | 318,614.00 | |
| කෙරෙමින් පවතින වැඩ - ඉඩම ගොඩකිරීම | | 803,000.00 | |
| | | 2,241,934.00 | |
| **යටිතල පිරියත හා උපකරණ** | **06** | | |
| යන්ත්‍ර | | 1,427,338.19 | 1,348,252.59 |
| ගෘහභාණ්ඩ | | 1,936,936.05 | 2,057,395.55 |
| වාහන | | 9,334,003.00 | 5,160,003.00 |
| පරිගණක | | 137,557.00 | 88,207.00 |
| වෛද්‍ය උපකරණ | | 35,355,560.01 | 31,753,648.60 |
| | | 48,191,394.25 | 40,407,506.74 |

| | | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **ඉඩම් හා ගොඩනැගිලි** | **07** | | |
| ඉඩම් | | 18,627,500.00 | 18,627,500.00 |
| ගොඩනැගිලි හා උපකරණ | | 134,952,084.79 | 136,668,982.60 |
| | | 153,579,584.79 | 155,296,482.60 |
| **උපචිත වියදම්** | **08** | | |
| විගණන ගාස්තු | | 650,000.00 | 560,000.00 |
| තාක්ෂණික කමිටු සාමාජික ගාස්තු | | 18,000.00 | 2,153.00 |
| විදුලිය | | 605,465.63 | 536,414.25 |
| දුරකථන ගාස්තු | | 52,764.20 | 38,020.23 |
| ඉන්ධන | | 75,096.00 | 50,820.00 |
| අළුත්වැඩියා සහ නඩත්තු I සහ | | | |
| රසායානාගාර රසායනික ද්‍රව්‍ය වියදම | | 959,912.27 | |
| වෛද්‍ය උපකරණ | | 11,236,000.00 | 8,095,000.00 |
| **ගෙවිය යුතු දෑ** | | | |
| ටෙන්ඩර් තැන්පතු | | 254,000.00 | 371,000.00 |
| විශේෂ අත්තිකාරම් | | | 250.00 |
| රඳවාගත් මුදල් | | 297,395.00 | 694,315.50 |
| **ගෙවිය යුතු සේවක ප්‍රතිලාභ** | | | |
| වැටුප් පාලන ගිණුම | | 263,610.00 | 162,010.00 |
| වැටුප් පාලන ගිණුම | | 312,210.00 | 281,560.00 |
| වැටුප් ගිණුම | | 614,753.34 | 14,000.00 |
| වැටුප් ගිණුම | | | 53,603.00 |
| වැටුප් ගිණුම | | | 93,484.00 |
| අතිකාල - හෙද නිලධාරී | | 258,136.00 | 245,699.00 |
| අතිකාල - අතුරු වෛද්‍ය නිලධාරී | | 27,052.00 | 23,566.00 |
| අතිකාල - අනෙකුත් සේවක මණ්ඩල | | 21,843.00 | 20,099.00 |
| අතිකාල - සුළු සේවක | | 220,526.00 | 207,106.00 |
| අතිරේක සේවා දීමනා වෛද්‍ය නිලධාරී | | 162,141.00 | 115,700.00 |
| සුභසාධක සංගමය | | 5,117.00 | 12,555.00 |
| අතිරේක සේවා දීමනා වෛද්‍ය නිලධාරී | | | 9,660.00 |
| වැටුප් ගිණුම | | | 236,814.00 |
| පෙර වර්ෂ ගැලපීම් | | | 176,250.00 |
| | | 16,034,021.44 | 12,000,078.98 |

| | | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| **ණයගැතියෝ** | **09** | | |
| එස්.පී.සී. | | 8,802,442.12 | |
| එම්.එස්.ඩී. | | 6,120,274.70 | 3,091,135.70 |
| සුපර් විල්ෂයින් | | 1,817,380.21 | 1,854,238.68 |
| වාර්මින් සෙකියුරිටි | | 469,700.00 | 434,560.00 |
| ශ්‍රීපී ඉංජිනියරින් | | 1,686,899.72 | 664,919.33 |
| එරන්දි සප්ලයර්ස් | | 1,707,394.71 | 1,208,605.73 |
| නලින් තුෂාර | | 120,000.00 | 49,088.00 |
| | | 20,724,091.46 | 7,302,547.44 |
| **සංචිත** | **10** | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 17,616,699.70 | 13,109,865.91 |
| | | 17,616,999.70 | 13,109,865.91 |
| **මූලධන හා සංචිත** | **11** | | |
| විජය කුමාරතුංග අනුස්මරණ පදනම | | 29,632,139.32 | 29,632,139.32 |
| ආයෝජන මණ්ඩලය | | 28,155,751.12 | 28,155,751.12 |
| නාගරික සංවර්ධන අධිකාරිය | | 18,000,000.00 | 18,000,000.00 |
| | | 75,787,890.44 | 75,787,890.44 |

**රජයේ ප්‍රදාන - මූලධන** 12

| | 2013.01.01 දිනට ශේෂය<br>Rs. | කාලපරිච්ඡේදයේ එකතුවීම්<br>Rs. | ක්‍රමක්ෂය<br>Rs. | 2013.12.31 දිනට ශේෂය<br>Rs. |
|---|---|---|---|---|
| රජයේ ප්‍රදාන - මූලධන | 109,226,665.05 | 27,050,000.00 | 14,969,581.80 | 121,307,083.25 |
| වාහන - කැබ් WPPC | | | | |
| 4087 මහා භාණ්ඩාගාර පරිත්‍යාග | | 5,600,000.00 | 1,120,000.00 | 4,480,000.00 |
| ගිලන්රථය – WPLW 0961 | | | | |
| සෞඛ්‍ය අමාත්‍යාංශයේ පරිත්‍යාග | | 7,180,000.00 | 1,436,000.00 | 5,744,000.00 |
| | **109,226,665.05** | **39,830,000.00** | **17,525,581.80** | **131,531,083.25** |

| | | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| **සමුච්චිත ඌණතාවය / අතිරික්තය** | **13** | | |
| 2013.01.01 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය | | (12,418,849.30) | (13,105,137.55) |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ ඌණතාවය | | (18,942,939.20) | 3,646,870.46 |
| පෙර වර්ෂයේ ලාභයට ගැලපීම් | | (1,931,745.33) | (2,960,582.21) |
| | | (33,293,533.83) | (12,418,849.30) |

| | | | |
|---|---|---|---|
| **අනෙකුත් ආදායම්** | **14** | | |
| පෞද්ගලික වෛද්‍ය සහතික ගාස්තු | | 199,900.00 | 210,450.00 |
| විවිධ ආදායම් | | 93,320.15 | 24,300.00 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් | | 121,500.00 | 139,000.00 |
| ආපදා ණය පොලී | | 158,443.73 | 149,043.34 |
| අක්ෂි ශල්‍යකර්ම | | 14,727,750.00 | 9,877,250.00 |
| සාමාන්‍ය ශල්‍යකර්ම | | 135,000.00 | 114,000.00 |
| විශේෂ අත්තිකාරම් පොලී | | 6,921.72 | 6,932.46 |
| විගණන විමසුම් අයකර ගැනීම | | | 24,225.00 |
| නේවාසික කුලී | | 16,768.00 | |
| FFA | | 19,750.00 | |
| FLT | | 92,250.00 | |
| Peripheral | | 63,000.00 | |
| LID | | 11,000.00 | |
| Yag PI | | 33,000.00 | |
| PRP | | 125,300.00 | |
| HVF | | 80,000.00 | |
| Yag Capsulomy | | 650,300.00 | |
| | | 16,534,203.60 | 10,545,200.80 |

| | | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වියදම්** | 15 | | |
| **වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ** | | | |
| වැටුප් පාලන ගිණුම | | (409.67) | (150.22) |
| වැටුප් හා දීමනා | | 71,297,393.48 | 64,542,410.98 |
| සේවක අර්ථසාදක අරමුදල 12% | | 4,456,215.01 | 4,212,512.67 |
| සේවක භාරකාර අරමුදල 3% | | 1,114,053.76 | 1,053,128.20 |
| අතිකාල - අනෙකුත් කාර්ය මණ්ඩල | | 277,124.50 | 287,917.52 |
| අතිකාල - අතුරු වෛද්‍ය කාර්ය මණ්ඩලය | | 410,347.60 | 391,376.21 |
| අතිකාල - හෙද නිලධාරී | | 3,848,670.49 | 2,519,165.90 |
| අතිකාල - සුළු සේවක | | 2,930,555.50 | 2,655,412.50 |
| අමතර රාජකාරී දීමනා - වෛද්‍ය නිලධාරී | | 1,622,335.00 | 1,531,444.30 |
| පාරිතෝෂික වියදම් | | 4,906,904.56 | 3,466,389.26 |
| | | 90,863,190.23 | 80,659,607.32 |

| | | | |
|---|---|---|---|
| **සැපයුම්** | 16 | | |
| රසායනාගාර රසායනික ද්‍රව්‍ය | | 870,933.79 | 628,060.49 |
| X කිරණ පටල සහ රසායනික ද්‍රව්‍ය | | 193,042.55 | 172,855.50 |
| දන්ත පාරාභෝජ්‍ය | | 55,433.18 | 49,680.88 |
| පාරිභෝජ්‍ය - වෛද්‍ය උපකරණ | | 2,357,404.39 | 694,013.98 |
| නිල ඇඳුම් | | 1,045,859.00 | 812,510.00 |
| ගෑස් | | 608,887.00 | 439,820.00 |
| ඖෂධ | | 31,282,073.91 | 25,455,449.20 |
| රෙදි පිළි | | 290,718.04 | 232,582.34 |
| පාරිභෝජ්‍ය - පොදු ගබඩාව | | 657,466.86 | 630,314.02 |
| | | 37,361,818.72 | 29,115,286.41 |

| | | | |
|---|---|---|---|
| **ක්ෂය වීම්** | 17 | | |
| ගොඩනැගිලි සහ සවිකිරීම් | | 3,158,029.90 | 3,129,648.95 |
| වාහන | | 3,006,000.00 | 1,635,756.58 |
| දේපල පිරියත සහ උපකරණ | | 484,038.70 | 448,135,78 |
| යන්ත්‍ර | | 394,387.20 | 386,991.78 |
| පරිගණක | | 54,900.00 | 59,287.00 |
| වෛද්‍ය උපකරණ | | 10,449,123.50 | 11,284,262.27 |
| | | 17,546,479.30 | 16,944,082.36 |

| | | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| **ගමන් වියදම්** | 18 | | |
| ගමන් වියදම් හා සංයුක්ත දීමනා (අනෙකුත් කාර්ය මණ්ඩල) | | 21,362.00 | 21,479.00 |
| **නඩත්තු වියදම්** | | | |
| ලිපි ද්‍රව්‍ය | | 413,665.33 | 267,666.8 |
| විදුලිය | | 7,928,929.51 | 7,019,295.58 |
| ජලය | | 1,203,512.00 | 913,953.20 |
| දුරකථන ගාස්තු | | 458,008.89 | 587,013.14 |
| තැපැල් වියදම් | | 13,300.00 | 8,345.00 |
| **අළුත්වැඩියා සහ නඩත්තු** | | | |
| අළුත්වැඩියා සහ නඩත්තු – ගොඩනැගිලි | | 14,000.00 | 259,566.62 |
| අළුත්වැඩියා සහ නඩත්තු – යන්ත්‍ර | | 1,340,734.25 | 169,424.67 |
| අළුත්වැඩියා සහ නඩත්තු – වාහන | | 293,082.84 | 359,365.63 |
| අළුත්වැඩියා සහ නඩත්තු – පරිගණක 62,635.62 | | 58,666.70 | |
| අළුත්වැඩියා සහ නඩත්තු – වෛද්‍ය උපකරණ | | 489,815.00 | 388,329.32 |
| අළුත්වැඩියා සහ නඩත්තු (ii) | | 541,666.89 | 347,735.15 |
| **කොන්ත්‍රාත් සේවා** | | | |
| පිරිසිදු කිරීම | | 3,489,040.78 | 3,165,532.18 |
| ලොන්ඩ්‍රි වියදම | | 679,193.00 | 629,057.00 |
| ආරක්ෂක සේවය | | 2,809,807.84 | 2,609,801.60 |
| ආහාර සැපයීම් | | 5,082,015.66 | 5,016,671.02 |
| **වෙනත්** | | | |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | | 68,000.00 | 47,000.00 |
| විවිධ වියදම් | | 314,629.00 | 244,999.00 |
| පුවත්පත් දැන්වීම් වියදම | | 546,224.00 | 515,088.00 |
| රක්ෂණ - මුදල් සහ සංක්‍රමණ | | 16,458.99 | 11,996.11 |
| වෙනත් බැංකු ගාස්තු | | 46,885.37 | 45,997.00 |
| විගණක ගාස්තු | | 350,000.00 | 300,000.00 |
| **වාහන වියදම** | | | |
| ඉන්ධන | | 1,029,544.00 | 938,988.99 |
| රක්ෂණ | | 255,609.42 | 122,013.10 |
| ලියාපදිංචිය හා ආදායම් බලපත්‍ර ගාස්තු | | 17,084.88 | 15,307.83 |
| | | 27,481,236.35 | 24,067,261.61 |

## පසුගිය පස් වසර තුළ මූල්‍ය කාර්යසාධන ප්‍රවණතාවය

| අනු අං කය | විස්තරය | 2009(000) | 2010(000) | 2011(000) | 2012(000) | 2013(000) |
|---|---|---|---|---|---|---|
| 01 | වසර අවසානයට ජංගම නොවන මුළු වත්කම් | 167,390 | 170,387 | 184,632 | 195,703 | 201,770 |
| 02 | වසර අවසානයට ජංගම මුළු වත්කම් | 13,170 | 23,401 | 19,729 | 17,254 | 26,980 |
| 03 | වසර අවසානයට සමුච්චිත අරමුදල | 180,560 | 193,788 | 204,361 | 212,958 | 230,993 |
| 04 | වසර අවසානයට ජංගම නොවන මුළු බැරකම් | - | - | 115,044 | 109,226 | 120,187 |
| 05 | වසර අවසානයට ජංගම මුළු බැරකම් | 6,022 | 12,300 | 26,450 | 32,412 | 54,374 |
| 06 | කාලපරිච්ඡේදය අවසානයට වෙනත් ලැබීම් වල එකතුව | 98,243 | 114,143 | 132,355 | 154,433 | 152,873 |
| | රජයේ පරිත්‍යාග - පුනරාවර්ථන | 77,700 | 91,812 | 109,933 | 128,070 | 120,250 |
| | මූලධන පරිත්‍යාග | 3,000 | 24,000 | 19,000 | 10,000 | 191,200 |
| | ස්වකීය ආදායම් | 20,543 | 22,331 | 22,362 | 26,363 | 32,623 |
| 07 | කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය / ඌණතාවය | (3,546) | (6,510) | (3,944) | 3,646 | (20,378) |
| 08 | කාලපරිච්ඡේදය සඳහා මුළු මූලධන පිරිවැය | 8,628 | 14,827 | 25,921 | 21,744 | 24,745 |
| 09 | කාලපරිච්ඡේදය සඳහා මුළු සේවා පිරිවැය | 51,812 | 59,648 | 68,696 | 77,193 | 90,863 |
| 10 | වසර අවසානයට මුළු සේවක සංඛ්‍යාව | 129 | 144 | 144 | 145 | 163 |
| (A) | **අනුපාත**<br>මුළු ආදායමට ස්වකීය ආදායම | 21% | 19% | 17% | 17% | 21% |
| (B) | එක් සේවකයෙකු සඳහා මුළු සේවා පිරිවැය | 401.00 | 414.00 | 477.00 | 532.00 | 557.00 |

### කාර්යසාධන දර්ශක

| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| ප්‍රතිකාර කළ මුළු රෝගීන් සංඛ්‍යාව | | | | | |
| බාහිර | 264,447 | 274,848 | 265,864 | 259,994 | 266,342 |
| අභ්‍යන්තර | 15,774 | 15,774 | 12,372 | 14,079 | 15,963 |
| දිනකට රෝගීන් සඳහා වියදම | 1,505 | 1,676 | 2,032 | 2,133 | 2,303 |

# රෝගියෙකු සඳහා ඒකක පිරිවැය

**2013 වර්ෂයේ සමස්ථ පිරිවැය මුළු රෝගී දින සංඛ්‍යාවෙන් බෙදීමෙන් සහ බාහිර රෝගී සංඛ්‍යාව හයෙන් බෙදීමෙන් මෙම සංඛ්‍යාව ගණන් බලන ලදී.**

| | | |
|---|---|---|
| වසර සඳහා මුළු පිරිවැය | = | (Rs.)173,252,724.60 |
| මුළු රෝගී දින සංඛ්‍යාව | = | 30,827 |
| මුළු බාහිර රෝගී සංඛ්‍යාව | = | 266,342 |
| බාහිර රෝගීන් 6 = අභ්‍යන්තර රෝගීන් 1 | = | 266,342/ 6 |
| | = | 44,390 |
| මුළු රෝගී දින සංඛ්‍යාව | = | 30,827 + 44,390 |
| | = | 75,217 |
| එක් රෝගී දිනක් සඳහා පිරිවැය | = | 173,252,724.60/75,217 |
| | = | **2,303** |

# විජය කුමාරතුංග අනුස්මරණ රෝහල, සීදුව.

## සුවිශේෂී ගිණුම් ප්‍රතිපත්ති

1. **පොදු**

1.1 **සකස් කිරීමේ පදනම**

1.1.1. ශේෂ පත්‍රය ආදායම් ප්‍රකාශය සමකවල වෙනස්වීම් ගිණුම් ප්‍රතිපත්ති සහ මණ්ඩලයේ සටහන් ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකරණ ආයතනයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුව සකස් කරන ලදී.

1.1.2. මණ්ඩලයේ මුදල් ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතියට අනුව පිළියෙල කර ඇත.

1.1.3. මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් පිළියෙල කර ඇත.

1.2 **රජයේ ප්‍රධානය**

මණ්ඩලයට රජයේ ප්‍රධාන ක්‍රම දෙකකින් ලැබේ.

1. මූලධන ප්‍රදානය
2. පුනරාවර්තන ප්‍රදානය

1.2.1. මූලධන ප්‍රදානය රජයෙන් සපයනු ලබන කොටස් මූලධනයට සෘජුවම බැර කරනු ලැබේ.

1.2.2. පුනරාවර්තන ප්‍රදානය කාල සීමාව තුල ආදායම වශයෙන් සළකා ආදායම් සහ වියදම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

1.3 **බදු**

අදාල කාලසීමාව තුළ මණ්ඩලය ඌනතාවයක් ලබා තිබෙන බැවින් බදු පැනවීමට අවකාශයක් නොමැත.

1.4 **සංසන්දනාත්මක තොරතුරු**

ගිණුම් ප්‍රතිපත්ති නිරතුරුවම උපයෝගී කර ගෙන තිබන අතර, ඒවා පසුගිය වර්ෂයේ සංඛ්‍යා අනුකූලව පවතී.

2. **වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම**

2.1 **දේපල, ජනක යන්ත්‍ර සහ උපකරණ ක්ෂයවීම සහ යලි ඇගයීම**

2.1.1. දේපල, ජනක යන්ත්‍ර සහ උපකරණ පිරිවැය වන සේ සමුච්චිත ක්ෂයවීම අඩුකොට දක්වා ඇත. දේපල ජනක යන්ත්‍ර සහ උපකරණවල පිරිවැය වත්කම් ඒවායින් අපේක්ෂිත ප්‍රයෝජනය ලබා ගනු සඳහා ඒවා ක්‍රියාකාරී තත්වයට ගෙන ඒමට දරන ලද අනියම් වියදම් සමග ඉදිකිරීම් හෝ මිළදී ගැනීම් සඳහා දරන ලද පිරිවැයයි. සපයනු ලබන සේවාවන් අඛන්ඩව සිදුකරගෙන යාම සඳහා හෝ සපයනු ලබන, සේවාවල ධාරිතාව වැඩිකිරීම සඳහා ස්ථාවර ස්වභාවයේ වත්කම් ලබා ගැනිම පුළුල් කිරීම හෝ වැඩිදියුනු කිරීම සඳහා දරන ලද වියදම මූලධන වියදම වශයෙන් සලකනු ලැබේ.

2.1.2. නිරවුල් ඉඩම් හැර අනෙකුත් වත්කම් සඳහා සෘජු රේඛීය ක්‍රමය භාවිතා කොට පහත සඳහන් ප්‍රමාණයන්ට අනුව ක්ෂයවීම ගනන් බලා ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි සහ සවිකුරු | 2% |
| වාහන | 20% |
| ගෘහ භාණ්ඩ සවිකුරු සහ උපකරණ | 10% |
| යන්ත්‍ර සූත්‍ර | 15% |
| වෛද්‍ය උපකරණ | 15% |
| පරිගනක | 20% |

2.1.3 මිළදී ගැනීමේ හෝ අත්පත් කරගත් වර්ෂය සඳහා ක්ෂයවීම් වලට ප්‍රතිපාදන සලසා තිබෙන අතර ඈවර කරනු ලබන වර්ෂය තුළ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා දී නොමැත.

2.1.4 මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය සම්බන්ධයෙන් මුදල් සහ මුදල් සමක, සන්තක මුදල් සහ බැංකු ගත මුදල්වලින් සමන්විත වනු ඇත.

3. **බැරකම් සහ ප්‍රතිපාදන**

3.1 මූලධන බැඳීම් සහ අවිනිශ්චිත බැරකම් සියළුම වැදගත් මූලධන වියදම් බැඳීම් සහ අවිනිශ්චිත බැරකම්, ශේෂ පත්‍රයේ දිනට ගිණුම්වල එක් සටහනකින් දක්වා ඇත.

3.2 වට්ටෝරු භාණ්ඩ ඇගයීම. වට්ටෝරු භාණ්ඩ පිරිවැය මත ඇගයීමට ලක් කර තිබේ.

4. **ආදායම් සහ වියදම් ගිණුම**

4.1 ආදායම

4.1.1 පෞද්ගලික වෛද්‍ය සහතික ගාස්තු, රජයේ පුනරාවර්තන ප්‍රදානය සහ අනෙකුත් විවිධ ආදායම් මණ්ඩලයේ ආදායම නියෝජනය කරනු ලැබේ.

4.1.2 සියළුම ආදායම් එකතුවීමේ පදනම මත ගණන් බලා ඇත.

4.2 **වියදම**

4.2.1 වර්ෂය සඳහා අතිරික්තය සහ ඌනතාවය ගණන් බැලීමේදී රෝගී සත්කාර සේවාවන් සහ මූලධන වත්කම් කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා දරන ලද සියළු වියදම් එකතුවීමේ පදනම මත ආදායමට හර කර ඇත.

ආදායම් සහ වියදම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා එවැනි ක්‍රමයක් උපයෝගී කර ගැනීම නිසා වියදම්වල ස්වභාවය අනුව මණඩලයේ කාර්ය සාධනය මැනවින් විදහා දැක්වෙන බැව් අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

මගේ අංකය : එච්එම්/බී/ඩබ්ලිව්කේඑම්එච්/1/13/09

ඔබේ අංකය :

දිනය : 2014 සැප්තැම්බර් 30 දින

සභාපති,

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය

**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 197 අංක 38 දරණ මුදල් පණතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරණ මුදල් පණතේ 13(1) වගන්තිය සහ 1999 අංක 38 දරණ විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩල පණතේ 13(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පණතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පණතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2014 මැයි 02 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පණතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු. 46,185,718 වූ වත්කම් තවදුරටත් පරිහරණය කරන නමුත් වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තොග අගය කිරීමේදී නිවැරදි පිරිවැය යොදා නොගැනීම හේතුවෙන් ඖෂධ තොග වටිනාකද රු. 178,837 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව ඉකුත් වර්ෂ ගැලපීම්වල අගය රු. 1,931,745 ක් වුවද එම අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 799,980 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඉකුත් වර්ෂ ගැලපීම් අගය රු. 1,131,765 කින් අඩුවෙන් දක්වා තිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකාරිත්ව තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1999 අංක 38 දරණ විජය කුමාරතුංග ආරෝග්‍යශාලා අනුස්මරණ මණ්ඩල පණතෙහි 10 වගන්තිය | ආරෝග්‍යශාලාවේ දෛනික කටයුතු පරිපාලනය කිරීම සඳහා මණ්ඩලය විසින් කළමනාකරණ කමිටුවක් පත් කරනු ලැබිය යුතු වුවද, එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. |
| (ආ) 2008 වර්ෂයේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කළ ඖෂධ කළමනාකරණ අත්පොත | |
| I. 5 පරිච්ඡේදයෙහි 2 වගන්තිය | ඖෂධ ගබඩාවන්හි උපරිම වශයෙන් මාස 2 කට ප්‍රමාණවත් ආරක්ෂක තොගයන් පවත්වාගෙන යා යුතු වුවද රෝහලේ ප්‍රධාන ගබඩාව සහ බෙහෙත් ශාලා සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවට අනුව ඇතැම් ඖෂධයන්හි අධි තොග තත්ත්වයන් පවතින බවත් ඖෂධ සහ ශල්‍ය ද්‍රව්‍ය අතරින් වර්ග 7 කට අදාළව ඉදිරි මාස 6 කට වඩා අධික තොගයක් පැවති බවත් නිරීක්ෂණය විය. |
| II. 9 පරිච්ඡේදයේ 2 වගන්තිය | ඖෂධ ගබඩා කිරීමට අවශ්‍ය පරිසර සාධක ප්‍රමාණවත්ව නොතිබුණු ස්ථාන ලෙස ගබඩා යොදාගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය විය. |
| III. 9 පරිච්ඡේදයේ 8.1 වගන්තිය | රෝහල් කළමනාකරණ මණ්ඩලය වරින් වර ඖෂධ ගබඩා සම්බන්ධයෙන් පරීක්ෂාවන් සිදු කර ඖෂධ නිසි පරිදි ගබඩා කිරීම් සිදු වී ඇති බවට තහවුරු කරගත යුතු වුවද එසේ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

2013 ජනවාරි 01 දිනැති අංක SFA/01/2012 දරණ සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීමට අදාළ චක්‍රලේඛයෙහි 28 වන වගන්තියට අනුකූලව ගෙවීම් අනුමත කිරීමේ බලතල පැවරීමකින් තොරව, අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මට්ටමේ නිලධාරියෙකු විසින් අනුමත කළ යුතු රුපියල් මිලියන **5** ඉක්මවන ලද ගෙවීම් වවුචර් රෝහලේ පරිපාලන නිලධාරී විසින් අනුමත කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආරෝග්‍යශාලා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු. 18,942,939 ක ඌණතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 3,646,870 ක අතිරික්තයක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ රු. 22,589,809 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. මේ සඳහා ප්‍රධාන වශයෙන් රජයේ පුනරාවර්ථන ප්‍රදානය රු. 7,820,000 කින් අඩු වීමද, වෛද්‍ය උපකරණ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය වියදම රු. 1,663,390 කින් වැඩිවීමද, ඖෂධ වියදම රු. 5,826,625 කින් වැඩිවීමද, යන්ත්‍ර සේවා ගාස්තු වියදම රු. 1,171,309 කින් වැඩිවීමද බලපා තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

සේවා දිගුවක් ලබා නොදීම හේතුවෙන් හිටපු ගණකාධිකාරීවරයෙකු විසින් රෝහලට එරෙහිව නඩුවක් ගොනුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධනය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

සංඛ්‍යාව

| ප්‍රතිකාර ලත් රෝගීන් සංඛ්‍යාව | 2013 | 2012 | වැඩිවීම/ අඩුවීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| බාහිර රෝගී අංශය | 135,796 | 131,206 | 4,590 | 3 |
| හදිසි ප්‍රතිකාර ඒකකය | 18,518 | 19,017 | (499) | (3) |
| සායන | 112,030 | 109,771 | 2,259 | 2 |
| නේවාසික | 15,969 | 14,079 | 1,890 | 13 |
| | 282,313 | 274,073 | | |

| සිදු කරන ලද ශල්‍යකර්ම සංඛ්‍යාව | 2013 | 2012 | වැඩිවීම/ අඩුවීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| අක්ෂි | 10,247 | 8,180 | 2,067 | 25 |
| ලේසර් කිරීම් | 2,462 | 2,619 | (157) | (6) |
| සුළු අක්ෂි | 263 | 301 | (38) | (13) |
| සාමාන්‍ය | 131 | 150 | (19) | (13) |
| | 13,103 | 11,250 | | |

| සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|
| රසායනාගාර | 34,082 | 40,231 | (6,149) | (15) |
| X කිරණ | 3,424 | 3,422 | 2 | - |
| ඊ.සී.ජී. | 3,005 | 2,795 | 210 | 8 |
| | 40,511 | 46,448 | | |

වියදම

| අයිතමය | 2013 | 2012 | වියදමේ වැඩිවීම / අඩු වීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| රසායනාගාර ද්‍රව්‍ය | 870,934 | 628,060 | 242,874 | 39 |
| පාරිභෝගික හා වෛද්‍ය උපකරණ | 2,357,404 | 694,014 | 1,663,390 | 240 |
| X කිරණ | 193,042 | 172,855 | 20,187 | 12 |
| ඖෂධ | 31,282,074 | 25,455,449 | 5,826,825 | 23 |
| මුළු වියදම | 173,252,725 | 150,786,238 | 22,466,487 | 15 |
| ක්ෂයවීම් හා පාරිතෝෂික | 22,453,384 | 20,410,472 | 2,042,912 | 10 |
| රෝගී දිනක වියදම (ක්ෂයවීම්ද ඇතුළත්ව) | 2,310 | 2,058 | 252 | 12 |
| රෝගී දිනක වියදම (ක්ෂයවීම් හා පාරිතෝෂිත ගෙවීම් නොමැතිව) | 2,011 | 1,780 | 231 | 13 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අක්ෂි ශල්‍යකර්ම සංඛ්‍යාව සියයට 25 කින් ඉහළ ගොස් තිබුණද, සිදු කරන ලද සාමාන්‍ය ශල්‍යකර්ම සංඛ්‍යාව සියයට 13 කින් අඩු වී තිබුණි.

(ආ) ලේසර් කිරීම් සංඛ්‍යාව සියයට 6 කින් අඩු වී තිබුණු අතර සුළු අක්ෂි ශල්‍යකර්ම සංඛ්‍යාව ද සියයට 13 කින් අඩු වී තිබුණි.

(ඇ) රසායනාගාර ද්‍රව්‍ය වියදම සියයට 39 කින් වැඩි වී තිබුණද, රසායනාගාර පරීක්ෂණ සංඛ්‍යාව සියයට 15 කින් අඩු වී තිබුණි.

(ඈ) ඖෂධ වියදම සියයට **23** කින්ද, පාරිභෝගික හා වෛද්‍ය උපකරණ වියදම සියයට 240 කින්ද ඉහළ ගොස් තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හදිසි අවශ්‍යතාවක් මත Fully Automated Hematology Analyzer යන්ත්‍රයක් සීමිත මිල කැඳවීම් යටතේ රු. 2,500,000 කට මිලදී ගැනීමට ලේකම්වරයා විසින් අනුමැතිය ලබාදී තිබුණු අතර 2012 දෙසැම්බර් ඇණවුම් කර 2013 ජූලි මස 23 දින යන්ත්‍රය සපයා තිබූ නමුත්, යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපීවක (Reagents) 2013 අගෝස්තු මාසයේ ඇණවුම් කළද 2013 දෙසැම්බර් මාසයේදී ලබා දී තිබුණි.

මෙම යන්ත්‍රය මගින් සිදු කරනු ලබන Full Blood Count with D Count නමැති පරීක්ෂණය පැයකට අවම වශයෙන් පරීක්ෂණ ඒකක 60 ක ධාරිතාවයක පැවතියත් 2014 මැයි මාසයේදී සිදු කර ඇති සාමාන්‍ය පරීක්ෂණ සංඛ්‍යාව ඒකක 255 ක් වීම නිසා අධි ධාරිතාවයකින් යුක්ත යන්ත්‍රයක් බවසුද නිරීක්ෂණය විය.

(ආ) විවිධ වර්ගයේ පරීක්ෂණ **22** ක් පමණ සිදු කළ හැකි, පැයකට අවම වශයෙන් පරීක්ෂණ 300 ක් කිරීමේ ධාරිතාවයක් සහිත Fully Automated Biochemistry Analyzer යන්ත්‍රයක් රු. 8,736,000 කට 2013 ජූනි 13 දින රෝහල වෙත සපයා තිබුණු අතර 2014 මුල් මාස 6 සඳහා පරීක්ෂණ වර්ග 6 කට අදාළ පරීක්ෂණ අවස්ථා 477 ක් පමණක් කර තිබූ බව නිරීක්ෂණ විය. රෝහලේ රසායනාගාර කටයුතු ව්‍යාප්තව තිබුණත් අවශ්‍ය පුහුණු කාර්ය මණ්ඩලයක් බඳවාගෙන නොතිබුණි. මෙයට පුවත්පත් දැන්වීම් මගින් ඉල්ලුම්පත් කැඳවූවත් සුදුස්සන් නොමැති බවත්, අභ්‍යාසලාභී රසායනාගාර කාර්මික විද්‍යාඥ දෙදෙනෙකු බඳවාගෙන පුහුණුව සඳහා අනුයුක්ත කර ඇති බවත් සභාපති විසින් විගණනයට දන්වා තිබුණි.

(ඇ) 2009 මාර්තු 27 දිනැති අංක 02/19/2009 දරණ සෞඛ්‍ය අමාත්‍යාංශයීය චක්‍රලේඛයේ 4(i) ඡේදය ප්‍රකාරව හෙද නිලධාරියෙක් සතියකට පැය 36 ඉක්මවා සේවය කරන අමතර සේවා කාලය සඳහා අමතර සේවා දීමනා ගෙවිය යුතු වේ. සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී 2013 ජනවාරි මාසයේ සේවය කළ හෙද නිලධාරීන් 28 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු අතිකාල පැය ප්‍රමාණය ඉක්මවා පැය 626 ක් වෙනුවෙන් රු. 43,422 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රෝහලේ අක්ෂි ශල්‍යකර්ම සිදු කළ ශල්‍ය වෛද්‍යවරයෙක් විසින් 2009 වර්ෂයේ සිට අක්ෂි ශල්‍යකර්ම සිදු කිරීම නවතාලීම හේතුවෙන් 2000 වර්ෂයේ මිලදී ගත් රු. 765,000 ක් වටිනාකම වූ Operating Microscope නම් වූ වෛද්‍ය උපකරණය, වර්ෂ 4ක කාලයක සිට නිෂ්කාර්ය පැවතුණි.

(ආ) 2007 වර්ෂයේදී මිලදීගත් රු. 258,635 ක් වටිනා Vitreus Scissors – Vertical උපකරණය හා රු. 273,700 ක් වටිනා Vitreus Scissors – Horizontal උපකරණය 2008 වර්ෂයේ සිටම අක්‍රියව පැවති නමුත් සමාලෝචිත වර්ෂය තුළදී ද ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට පියවර ගෙන නොතිබුණි. මෙම උපකරණ දෙක 2014 වර්ෂයේදී අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන බව සභාපති විසින් විගණනයට දන්වා තිබුණි.

## 4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

රථගාල ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරු පිළිගත හැකි හේතු නොදක්වා ප්‍රතික්ෂේප කර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තියට පටහැනිව විධිමත් ගිවිසුමක්, අත්තිකාරම් බැඳුම්කරයක් හා සවිස්තරාත්මක පිරිවැය ඇස්තමේන්තුවක් නොමැතිව නව මිල කියුම ගෙන්වා ගත් දෙවන අවම මිල ඉදිරිපත් කළ කොන්ත්‍රාත්තරු වෙත අවසාන බිල්පත සහතික කිරීමකින් තොරව රු. 1,763,235 ක් ගෙවීම් කර තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

රෝහලේ 2013 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 211 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 157 ක් වූයෙන් 54 ක කාර්ය මණ්ඩල ඌණතාවයක් පැවතුණි. එම ඌණතාවය රෝහල් අධ්‍යක්ෂක තනතුරෙහිද, වෛද්‍ය කාර්ය මණ්ඩලයේ 13 ක් ද, හෙද කාර්ය මණ්ඩලයේ 16 ක් ද, අනෙකුත් රෝහල් සහායක සේවාවන්හි 8 ක් ද, කාර්යාල කාර්ය මණ්ඩලයෙහි 6 ක් ද, කම්කරු කාර්ය මණ්ඩලයේ 10 ක් ද වශයෙන් සමන්විත විය.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2013 - 2017 වර්ෂවලට අදාළ සංයුක්ත සැලැස්ම අනුව ක්ෂුද්‍රජීව විද්‍යා රසායනාගාරයක් 2013 වර්ෂයේදී ස්ථාපිත කළ යුතු බවට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 17 දිනදී එම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීම පමණක් සිදු කර තිබුණි.

එසේම අක්ෂි ඒකකය වැඩිදියුණු කිරීම සඳහා 2013 වර්ෂයේදී Non – Contact Biometry System, Occulocoherant Tomography සහ Other Ophthalmic Micro Instruments යනාදී උපකරණ මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද, එම කාර්යයන් ඉටු කිරීම ආරම්භ කර හෝ නොතිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

රෝහලටම වෙන් වූ අභ්‍යන්තර විගණන ඒකකයක් නොවූ අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරන අතර සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණන කටයුතු සිදු කර නොතිබුණි.

**5.3 විගණන කමිටු**

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් මාස 3 කට වරක් විගණන කමිටු ගස්විය යුතු බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.

**5.4 අයවැය ලේඛණමය පාලනය**

අයවැය ලේඛණය සහ තත්‍ය ආදායම් වියදම් අතර වියදම් විෂයයන් 6 කට අදාළව සියයට 29 සිට සියයට 96 දක්වා පරාසයක විචලනයන් වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී, නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර රෝහල් මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු විය යුතුව ඇත.

(අ) ඖෂධ ගබඩා පාලනය
(ආ) ආහාර ඇණවුම් කිරීම

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

ඔබේ අංකය : HM/B/WKMH/FA/2013
මගේ අංකය : WKMH/AC/2013
දිනය : 2014.06.25

ඩබ්ලිව්.ඒ.සී.කේ.පී. විරක්කොඩි
සහකාර විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දුව පාර
බත්තරමුල්ල

**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පණතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.
(ආ) 2014 මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.
(ඇ) ආයතනය තුළ දරණ සියළු වියදම් ඒවාට අදාළ වර්ගීකරණයන් යටතේම දක්වා ගිණුම් මාරු වීම් දෝෂ නිවැරදි කරගන්නා බව කාරුණිකව දන්වමි.
(ඈ) 2014 මූල්‍ය ප්‍රකාශන වලදී ක්‍රමක්ෂය වෙනම දැක්වීමට පියවර ගනු ලැබේ.
(ඉ) 2014 මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.
(ඊ) ගාස්තු නිදහස් කිරීමෙන් සිදු කර තිබූ ශල්‍යකර්ම වෙනුවෙන් වූ පිරිවැය අදාළ සටහන් 2014 මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.
(උ) 2014 මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.

**2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්**

i. ලීජී ඉංජිනියරින් ආයතනයේ හිඟ මුදල් පිළිබඳ ඔවුන්ගේ සංශෝධිත වාර්තාව එවා ඇති අතර එහි ශේෂය හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය අතර වෙනස රු. 670,832.64 කි. මෙම මුදල වායුසමීකරණ පද්ධතිය අක්‍රිය වීම පිළිබඳ ජනාධිපති විමර්ෂණ ඒකකය මඟින් සිදු කරන ලද පරික්ෂණයේදී නතර කරන ලද බිල්පත් වල වටිනාකම් වේ. ඊට අදාළ ලිපි අමුණා ඇත.

ii. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව - මීගමුව ශාඛාවට 2012.12.31 දින ගෙවන ලද රු. 2,442,629.64 ක මුදල 2012.12.31 දිනට අපගේ ගෙවිය යුතු ශේෂයක් සේ නොපෙන්වීම නිසා සනාතන වාර්තා අතර වෙනස සිදුව ඇත.

### 2.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකාරීත්ව තීරණවලට අනුකූල නොවීම.

(අ) 1999 අංක 38 දරණ විජය කුමාරතුංග අනුස්මරණ පණතෙහි 10 වගන්තිය ප්‍රකාරව ඉදිරියේදී කළමනාකරණ කමිටු පත්කර රෝහල් කටයුතු ක්‍රමවත්ව පාලනය කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

(ආ) 2008 වර්ෂයේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කළ ඖෂධ කළමනාකරණ අත්පොත -

i. 5 පරිච්ඡේදයෙහි 2 වගන්තිය අනුව විගණන විමසුමෙන් පෙන්වා දී ඇති Cotton Woll Roll 2013 වසර අග වන විට වෛද්‍ය සැපයීම් ආයතනයේ මෙන්ම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ද තොග හිඟයක් පැවතී ඇත. වෛද්‍ය සැපයීම් ආයතනයෙන් 2013 මුළු වාර්ෂික ඇස්තමේන්තුව වන Cotton Woll Roll 650 න් 150 ක් පමණක් ලබා දී තිබුණි. අළුතින් ආරම්භ කර පවත්වා ගෙන යනු ලබන තුවාල සත්කාර ඒකකයේ සීඝ්‍ර වර්ධනය සමඟ ඒ සඳහා පමණක් Cotton Woll Roll වල අවශ්‍යතාවය ඉතාමත් ඉහළ අගයක් ගෙන ඇති අතර රෝහලේ අනෙකුත් අංශ වල අවශ්‍යතාද එක්ව ගත් විට Cotton Woll Roll වල දැඩි අවශ්‍යතාවයක් පවතී. මෙම හේතුව නිසා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ තොග පැවති අවස්ථාවේ ඒකක 1000 මිලට ගෙන ඇත. තුවාල සත්කාර ඒකකයට පමණක්ම පැමිණ ඇති රෝගී සංඛ්‍යා දත්ත මේ සමඟ ඉදිරිපත් කරමි. කෙසේ වෙතත් විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි මාස 02 ක උපරිම තොග පවත්වා ගනිමින් හැකි සෑම විටම අදාළ නීති රෙගුලාසි පිළිපදින ලෙස උපදෙස් ලබා දුන් බව කාරුණිකව දන්වමි.

ii. 5 පරිච්ඡේදයෙහි II වගන්තිය අනුව මෙම රෝහලේ ප්‍රධාන ඖෂධවේදී ලෙස කටයුතු කරන නිලධාරියා විසින් ප්‍රධාන වෛද්‍ය නිලධාරීතුමියගේ පූර්ණ අධීක්ෂණය යටතේ ඇස්තමේන්තු පිළියෙල කිරීම, ඇණවුම් කිරීම, මිලදී ගැනීම, තොග පාලනය ආදී සියළු කටයුතු වල සියළුම ලිපි ලේඛණ කටයුතු තනිව සිදු කරනු ලබන අතර විවිධ අංශ අතර ඖෂධ බෙදාදීම ආදී රාජකාරී කටයුතුද තනිව සිදු කරනු ලබන නිසා රෝහලේ වාට්ටු වල හා ඩිස්පෙන්සරිය ඇති ඖෂධ තොග වරින්වර පරීක්ෂා කර ආයතන ප්‍රධානියාට වාර්තා කිරීමට කාලය යොදා ගැනීම දුෂ්කරව ඇත. නමුත් රෝහලේ ඖෂධ තොග වල විශේෂිත දැනුවත් කිරීම් ආයතන ප්‍රධානියාට වාර්තා කරනු ලැබේ. කෙසේ වෙතත් මෙම ඖෂධ තොග පිළිබඳ ආයතන ප්‍රධානියාට වාර්තා කිරීමේ නීතිමය අවශ්‍යතාවය පිළිබඳ කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කර සුදුසු වැඩපිළිවෙලක් යොදන බව දන්වා සිටිමි.

iii. 9 පරිච්ඡේදයෙහි 2 වගන්තිය අනුව සීමිත ඉඩ පහසුකම් යටතේ රෝහල මඟින් සිදු කරනු ලබන රෝගී සේවාවන් ඉතා සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති අතර ප්‍රධාන ඖෂධ ගබඩාව සඳහා ලබා දිය හැකි උපරිම ඉඩ පහසුකම් යටතේ ගබඩා පාලන කටයුතු සිදු කරනු ලබන දැනට ඉදි වෙමින් පවතින නව ගොඩනැගිල්ලේ ඖෂධ ගබඩාව සඳහා කොටසක් වෙන් කර ඇත. ඒ වන තෙක් හැකි උපරිම මට්ටමින් සුදුසු පාරිසරික තත්ත්වයන් යටතේ ඖෂධ ගබඩා කිරීමට අවශ්‍ය කටයුතු යොදන බව කාරුණිකව දන්වා සිටිමි.

iv. 9 පරිච්ඡේදයෙහි 8.1 වගන්තිය අනුව ඖෂධ ගබඩා කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාර වෛද්‍ය නිලධාරීතුමිය විසින් අවධානය යොමු කළද ඒ සම්බන්ධ ලේඛණ පවත්වා ගැනීමක් සිදු වී නොමැත. එම නිසා ඉදිරියේදී ඖෂධ ගබඩාව සම්බන්ධයෙන් පරීක්ෂා කර අවශ්‍ය ලේඛණ පවත්වා ගන්නා බව දන්වා සිටිමි.

### 2.2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

2013 ජනවාරි 01 දිනැති සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ SFA/01/2012 දරණ මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීමට අදාළ චක්‍රලේඛ අංක 28 වන වගන්තිය ප්‍රකාරව මෙම රෝහලට අදාළ මුදල් බලතල පැවරීමේ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර අවශ්‍ය අනුමැතීන් ඉදිරියේදී ලබා ගෙන ඒ අනුව කටයුතු කරන බව දන්වා සිටිමි.

### 3.3 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

දැනට මෙම නඩුව සමථයකට පත්ව ඇති අතර අදාළ ගෙවීම් සහ අයකරගැනීම්ද සිදු කර හමාර කර ඇත.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) i. මේ සඳහා 2012 වසරේ සීමිත මිල ගණන් කැඳවන ලද්දේ 2012 වසරේ ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගැනීමට සීමිත කාලයක් තිබූ බැවිනි. එසේ වූයේ එසේ වූයේ පහත කාරණය නිසාය.

2012 වසරේ ක්‍රියාකාරී සැලැස්මෙහි වූ අක්ෂි ශල්‍ය උපකරණ මිලදී ගැනීමට අක්ෂි ශල්‍ය වෛද්‍යවරයාගේ සහයෝගය නොලැබීමත් ඔහුගේ අවිනිශ්චිතභාවයත් නිසා නොහැකි විය. නමුත් රෝහලේ අක්ෂි ඒකකයට අවශ්‍යව තිබූ එම උපකරණ මිලදී ගැනීම නවතා නොදැමීමට තීරණය විය.

ඒ වෙනුවට ජාතික අක්ෂි රෝහලේ වෙනත් අක්ෂි ශල්‍ය වෛද්‍යවරියක් පත් කර ගෙන එම උපකරණ වලින් උපකරණ කීපයක් පමණක් මිලදී ගැනීමට හැකි විය. ඉතිරි උපකරණ 2013 වසරේ මිලදී ගැනීමට තීරණය විය.

මේ කාලය වන විට වසරේ අගභාගයට පැමිණ තිබුණි. තව දුරටත් 2012 ප්‍රතිපාදන වලින් රු. මිලියන 13 ක් පමණක් ඉතිරිව තිබුණි.

රෝහලේ ඊලඟ වැඩිදියුණු කිරීමේ පියවර ලෙස අපේක්ෂිතව තිබූ ඉහත රසායනාගාර උපකරණය (Fully Automated Hematology Analyzer) මිලදී ගැනීමට තීරණය විය. එම කටයුතු කර ගැනීමට සීමිත කාලයක් තිබූ නිසා කඩිනමින් මෙම කටයුතු අවසන් කර ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි සීමිත මිල ගණන් කැඳවීමට සිදු විය.

ii. දෙවන මිල ගණන් දන්වා එවා තිබූ ආයතනයෙන් මිලදී ගන්නා ලද්දේ තාක්ෂණ ඇගයීම් කමිටුවෙන් සහ ටෙන්ඩර් මණ්ඩලයෙන් ගත් තීරණ අනුවය.

සැපයීමේ ප්‍රමාදය - Bio Medica Pvt Ltd
Bio Medica ආයතනය වෙත යවන ලද ගැණුම් ඇණවුම පිළිගෙන ඔවුන් විසින් රු. 250,000 ක් වටිනා කාර්ය සාධන ඇපකරයක්ද ඉදිරිපත් කර ඇත. නමුත් අදාළ යන්ත්‍රය සැපයීම ප්‍රමාද නිසා ඒ සම්බන්ධව රෝහල විසින් 2013.03.10 දින Bio Medica ආයතනය වෙත ප්‍රමාදය පිළිබඳ විමසා ලිපියක් යවා ඇත. ප්‍රමාදය සම්බන්ධව ඔවුන් විසින් එවන ලද පිළිතුර ටෙන්ඩර් මණ්ඩලය වෙත යොමු කර ඇත. එම පිළිතුර සාධාරණ හේතුවක් බව ටෙන්ඩර් මණ්ඩලය විසින් පිළිගෙන ඇත. නියමිත දිනට මාස 4 කට පමණ පසු යන්ත්‍රය සපයන ලදී.

iii. අදාළ ප්‍රතිජීවක සඳහා ගැණුම් ඇණවුමෙහි දිනය 2013.08.10 ලෙස සඳහන් වී ඇත්තේ වැරදීමකින්ය. එය 2013.10.05 විය යුතුය.

එම ප්‍රතිජීවක ප්‍රථම වතාවට සපයන බැවින් එයින් sample කොටසක් ප්‍රථමයෙන්ම ලබා දී test, control වැනි දෑ සිදු කළ යුතුය. තවද එයින් ලැබෙන report නිවැරදි දැයි පරීක්ෂා කිරීමට වෙනත් යන්ත්‍රයක report සමඟ cross check කළ යුතුය.

එම පරීක්ෂණ සාර්ථක වූ පසු අප විසින් ඇණවුම් කළ නියමිත reagent ප්‍රමාණය ගෙන්වා ගන්නා ලදී. ඒ සඳහා මාස 2 ක් පමණ ගත විය.

iv. 2012 වසරේ ඉතිරි වී තිබූ ප්‍රතිපාදන අපතේ යා නොදී ප්‍රයෝජනයට ගැනීමට තීරණය වූ නිසා හදිසියේ මිලදී ගැනීමට කටයුතු කරන ලදී.

යන්ත්‍රය භාවිත කිරීමට ප්‍රමාද වීමට හේතු -

a. 2012 වසරේ ඇණවුම් කළ මෙම යන්ත්‍රය රෝහල වෙත ලැබුණේ 2013 ජුනි මසය.
b. යන්ත්‍රය සවි කිරීමේදී විදුලි සැපයුම සම්බන්ධව ද ගැටළුවක් පැනනැඟිනි. එවකට රසායනාගාරයේ තිබූ විදුලි සැපයුම ප්‍රමාණවත් නොවූ බැවින් ප්‍රධාන සැපයුමේ සිට සම්පූර්ණයෙන්ම අළුත් විදුලි සැපයුමක් ලබා දීමට සිදු විය. මේ සඳහාද කාලය ගත විය.
c. නවීන තාක්ෂණයෙන් යුත් මෙම යන්ත්‍රය මඟින් පරීක්ෂණ විශාල සංඛ්‍යාවක් කළ හැක. මෙම සියළු පරීක්ෂණ එකින් එක කරමින් ඒවායේ නිවැරදිතාවය වෙනත් යන්ත්‍රයක් සමඟ සසඳා තහවුරු කර ගත යුතු අතර ඒ සඳහාද සැලකිය යුතු කාලයක් ගත විය.

v. අධි ධාරිතාවය

ප්‍රායෝගිකව මෙම යන්ත්‍රයෙන් පැයකට ඒකක 60 ක් කිරීමට හැකියාවක් නැත.

මේ වන විට මසකට පරීක්ෂණ අඩු ප්‍රමාණයක් සිදු කළ ද කායික වෛද්‍යවරයාගේ පැමිණිම මත එය තව 4 ගුණයකින් පමණ වැඩි වේ යැයි අපේක්ෂා කෙරේ. දැනට රෝහලේ පවතින්නේ අවුරුදු 13 ක් පමණ පැරණි Semi Automated Hematology Analyzer – 3 part යන්ත්‍රයකි. විජය කුමාරතුංග අනුස්මරණ රෝහල සෑම වසරකම කොටසක් හෝ වැඩිදියුණු කරන තත්ත්වයක පවතී. රෝහලේ ප්‍රධාන සැලැස්ම (Master Plan) අනුව Surgeon යන අය බඳවා ගැනීම සහ මෙම රෝහල Regional Diabetic Centre එකක් බවට පත් කිරීමට සැලසුම් කර ඇත. අප රෝහලේ වර්තමාන වැඩකටයුතු කරගෙන යනු ලබන්නේ ඉහත සැලැස්ම ඉලක්ක කර ගනිමිනි. රජයේ ප්‍රතිපත්ති අනුව ඉදිරි කාලය ගැන සලකා වර්තමානයේ කරන කටයුතු සැලසුම් කර ගනී. ඒ අනුව කිරීමට නියමිත පරීක්ෂණ සඳහා අවශ්‍ය උසස් තාක්ෂණයෙන් යුත් යන්ත්‍රයක් පිළිබඳ සොයා බැලීමේදී ඇත්තේ Fully Automated Hematology Analyzer – 5 Part යන්ත්‍රය බව දැනගන්නට ලැබිණි. Semi Automated Hematology Analyzer – 3 Part යන්ත්‍රයත් Fully Automated Hematology Analyzer – 5 Part යන්ත්‍රයත් අතර යන්ත්‍රයක් නොමැත. එබැවින් මිලදී ගැනීමට ඇත්තේ රෝහල විසින් මිලදී ගත් Fully Automated Hematology Analyzer – 5 Part යන්ත්‍රය පමණි.

තවද මෙම යන්ත්‍රයේ කාර්යක්ෂමතාව පිළිබඳ සැලකිල්ලට ගැනීමේදී අඩු ශ්‍රමයකින් වැඩි පරීක්ෂණ සංඛ්‍යාවක් කිරීමට හැකිය. එහිදී දැනට සිටින එක් වෛද්‍ය රසායානාගාර කාර්මිකගෙන් වැඩි පරීක්ෂණ සංඛ්‍යාවක් කර ගත හැකිය.

(ආ) i. මෙම යන්ත්‍රය 2013 ජුනි මස සවිකිරීම් කටයුතු අවසන් කළද එම යන්ත්‍රයෙන් අදාළ පරීක්ෂණ ආරම්භ කිරීමට පෙර පියවර කීපයක් අනුගමනය කළ යුතුය.

- ඒ සඳහා අවශ්‍ය Calibration, Control සිදු කළ යුතුය.
- පසුව රෝහලේ සිටින වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ඒ සඳහා මනා ලෙස පුහුණු විය යුතුය.
- යන්ත්‍රයෙන් කළ හැකි පරීක්ෂණ එකින් එක සිදු කර ලැබෙන ප්‍රතිඵල වෙනත් යන්ත්‍රයක ප්‍රතිඵල සමඟ පරීක්ෂා කළ යුතුය.
- සෑහීමකට පත් වන තෙක් නැවත නැවත පරීක්ෂා කළ යුතුය.
- කරුණු එසේ වුවද අප රෝහලේ දැනට ඇත්තේ එක් වෛද්‍ය රසායානාගාර කාර්මික විද්‍යාඥයෙක් බැවින් එදිනෙදා කටයුතුත් සමගම මෙම පරීක්ෂණ කටයුතුද කළ යුතුය.

ඉහත කරුණු නිසා මෙම යන්ත්‍රය මාස 6 ක් පමණ පරීක්ෂණ මට්ටමේ පැවතිණි. එබැවින් රෝහල් කටයුතු සඳහා මෙම යන්ත්‍රය සම්පූර්ණයෙන්ම යොදා ගැනීමට ප්‍රමාද විය.

ii. මෙම යන්ත්‍රයෙන් පරීක්ෂණ වර්ග 22 ක් පමණ සිදු කළ හැකි වුවද එකවර මෙම පරීක්ෂණ සියල්ල සිදු කළ නොහැක.
සියළුම පරීක්ෂණ පියවරෙන් පියවර පරීක්ෂා කර බලා ප්‍රතිඵල ලබා ගෙන රෝහල් කටයුතු සඳහා යොදා ගත යුතුව ඇත.
ඉදිරියේදී පරීක්ෂණ වර්ග සියල්ලම කිරීමට කටයුතු කරනු ලැබේ.

iii. ප්‍රායෝගිකව මෙම යන්ත්‍රයෙන් පැයකට පරීක්ෂණ ඒකක 300 ක් සිදු කළ නොහැක. එක් පරීක්ෂණයකට විනාඩි 2 ක් වත් වැය වේ.
දැනට රෝහලේ දෛනික අවශ්‍යතාව පහළ අගයක පැවතියද කායික වෛද්‍යවරයාගේ පැමිණීමත්, තුවාල සත්කාර ඒකකයේ වැඩි වෙමින් පවතින රෝගී සංඛ්‍යාවත් නිසා එම අවශ්‍යතාවය ඉහළ යමින් පවතී.
විජය කුමාරතුංග අනුස්මරණ රෝහල සෑම වසරකම කොටසක් හෝ වැඩිදියුණු කරන තත්ත්වයක පවතී. බොහෝ දුරට ප්‍රධාන සැලැස්ම (Master Plan) ක්‍රියාත්මක කිරීමට උත්සහ කරයි. අවසාන Master Plan අනුව Physician සහ Surgeon යන අය බඳවා ගැනීම සහ Regional Diabetic Centre එකක් බවට පත් කිරීමට සැලසුම් කර ඇත. අප රෝහලේ වර්තමාන වැඩකටයුතු කරගෙන යනු ලබන්නේ ඉහත සැලැස්ම ඉලක්ක කර ගනිමිනි. රජයේ ප්‍රතිපත්ති අනුව ඉදිරි කාලය ගැන සලකා වර්තමානයේ කරන කටයුතු සැලසුම් කර ගනී. ඒ අනුව රසායනාගාර කටයුතු ව්‍යාප්ත කිරීමට ඉහත යන්ත්‍රය අවශ්‍ය වේ.

iv. මේ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කීප වතාවක්ම ඉල්ලුම් කරන ලදී. පුවත්පත් දැන්වීමක්ද පළ කරන ලදී. නමුත් ඒ සඳහා සුදුසු අයෙකු නොසිටිය බැවින් අභ්‍යාසලාභී රසායනාගාර කාර්මික විද්‍යාඥ දෙදෙනෙකු බඳවාගෙන පුහුණුව සඳහා අනුයුක්ත කර ඇත.

(ඇ) i. මෙම විගණන විමසුමෙන් පෙන්වා දී ඇති හෙද නිලධාරීන්ගේ සේවා මුර සකස් කිරීම සම්බන්ධයෙන් විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරිනියගෙන් විමසන ලද අතර එම නිලධාරිනිය මෙම හෙද නිලධාරීන්ගේ සේවා මුර සකස් කිරීම ඔවුනටම අදාළ වූ ක්‍රියාපටිපාටියක් බව ලිඛිතව මා වෙත දන්වා ඇති බව කාරුණිකව දන්වමි.

ii. විගණන විමසුමෙන් පෙන්වා දී ඇති හෙද නිලධාරිනීන්ගේ අතිකාල ගෙවීමේ ක්‍රමවේදය විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරිනියගේ මෙන්ම උතුරු කොළඹ ශික්ෂණ රෝහලෙන්, මීගමුව මූලික රෝහලෙන් විමසුවිට දැනට අප අනුගමනය කරන ක්‍රමවේදය ඔවුන් අනුගමනය කරන බවත් මෙම ක්‍රමය ඔවුන් දිනාගත් වෘත්තීය ක්‍රියාමාර්ගයක් බවත් දන්වන ලදී. ඒ අනුව ඉදිරියේදී යම් වෙනසක් සිදුවේ නම් ඊට අදාළව අනෙකුත් ආයතන විසින් අනුගමනය කරනු ලබන වෙනස්කම් සිදු කරගන්නා බව කාරුණිකව දැනුම්දෙමි.

### 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) විගණන විමසුමින් පෙන්වා දී ඇති පරිදි බිත්තර ඇණවුමේ වෙනසට එක් හේතුවක් වනුයේ දියවැඩියා රෝගීන්ට සහ අධිපෝෂිත ආහාර ලබා දෙන රෝගීන්ගේ ආහාර සඳහා ලබා දෙන බිත්තර ප්‍රමාණය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට අතපසු කර තිබීමයි. 2013.03.22 සිට 2013.09.08 දක්වා අදාළ විෂයභාර නිලධාරිනිය විසින් ඇණවුම් පරීක්ෂා කර ඇති අතර එහිදී දෛනික රෝගීන් හා සේවකයන් ප්‍රමාණය ඇතුළත් කළ විට අදාළ දිනයන්හිදී ඇණවුම් කළ යුතු ආහාර ප්‍රමාණයන් ලබා දෙන පරිගණක දත්ත ඇතුළත් වැඩසටහනේ සිකුරාදා දින වැරදි ලෙස බිත්තර **03** ක් එකතු වී ලබා දෙන්නා වූ බිත්තර ප්‍රමාණය ඇණවුම් කර තිබීම මෙම වෙනසට තවත් හේතුවකි. ඊට අමතරව සමහර දිනවලදී සිදුව ඇති වැඩිවීම් සඳහා සාධාරණ හේතුවක් සොයා ගැනීමට අපොහොසත් වී ඇත. වෙනස්කම් පවතින දින වල විස්තර අමුණා ඇත.

දියවැඩියා රෝගීන්ට සහ අධිපෝෂිත ආහාර ලබා දෙන රෝගීන්ගේ ආහාර සඳහා ලබා දෙන බිත්තර ප්‍රමාණය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට අතපසුකර තිබීම හැරුණු විට සත්‍ය වශයෙන්ම වැඩිපුර ඇණවුම් කරන ලද බිත්තර ප්‍රමාණය 122 කි. 2013.09.08 දිනෙන් පසු මෙම තත්ත්ව නිවැරදි කර ඇති බව කාරුණිකව දන්වා සිටින අතර මෙවැනි අතපසුවීම් හැකිතාක් නිවැරදි කර ගන්නා බවද තවදුරටත් දන්වා සිටිමි.

(ආ) විගණනයෙන් පෙන්වා දී ඇති Amoxcilin ඖෂධය Co-Amoxyclave ඖෂධය ලෙස නිවැරදි විය යුතු බව කාරුණිකව දන්වා සිටින අතර Co-Amoxyclave ඖෂධය 2013 වසර සඳහා ඇස්තමේන්තු කිරීමේදී මි. ග්‍රෑම් 625 මාත්‍රාව අඩංගු පෙති 5000 කුත් මි. ග්‍රෑම් 375 මාත්‍රාව අඩංගු පෙති 2000 කුත් වශයෙන් මුළු ප්‍රමාණය 7000 ලෙස ගණනය කර ඇති අතර එම දෙවර්ගයම ප්‍රධාන ගබඩාවේ එකම තොගයක් ලෙස ගෙන භාවිතා කිරීම සිදු කර ඇත. ඒ අනුව මෙම ප්‍රමාණය වර්ග දෙකක් සේ ගෙන සැලකීමේදී ඇස්තමේන්තු ප්‍රමාණය ඉක්මවා ලබා ගෙන නොමැති බව දන්වමි.

2013 ජූලි මාසයේදී මෙම ඖෂධයෙන් කල් ඉකුත් වීමට ආසන්න ඒකක 4800 ප්‍රමාණය ප්‍රධාන වෛද්‍ය නිලධාරිතුමියගේ අධීක්ෂණය යටතේ මීගමුව රෝහලෙන් ලබා ගෙන ඇත්තේ එකී ඖෂධය හැකි ඉක්මණින් රෝගීන්ට ලබා දී තොග අවසන් කර නාස්තිය අවම කර ගැනීමට මීගමුව රෝහලට සහයෝගයක් වශයෙනි. මීගමුව රෝහලෙන් Co-Amoxyclave ඖෂධය නොමිලේ ලබා ගෙන මෙම රෝහලේ භාවිතා කිරීම නිසා අප සතු කල් ඉකුත් වීමේ අවධානමක් නොමැති තොග ඉතිරි කර ගැනීමට හැකි වූ අතර එම ප්‍රමාණයෙන් රෝහලට Co-Amoxyclave ඖෂධය නැවත මිලදී ගැනීමට යන වියදම ඉතිරි කර ගැනීමට හැකි වී ඇත.

### 4.4 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

(අ) දැනට රෝහලේ කාර්යයේ නියුතු අක්ෂි වෛද්‍යවරයා විසින් ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්මය ඇතුළු තවත් බොහෝ ශල්‍යකර්ම සිදු කරන බැවින් මෙම සියළු ශල්‍යකර්ම කළ හැකි එක් වෛද්‍ය උපකරණයක් භාවිතා කරයි. ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්මය පමණක් කළ හැකි Operationg Microscope යන්ත්‍රය දෛනිකව භාවිතා නොවුනද විදුලිබලය රහිතව වුවද භාවිතා කළ හැකි මෙම යන්ත්‍රය හදිසි විදුලි බිඳවැටීමකදී හෝ වෙනත් නොවැලැක්විය හැකි ගැටළු අවස්ථා වලදී වහාම ප්‍රයෝජනයට ගනු ලබන අතර නව අක්ෂි වෛද්‍යවරයා පැමිණි වහාම මෙම උපකරණය අඛණ්ඩව භාවිතා කිරීමට කටයුතු යොදා ඇත.

(ආ) මෙම ශල්‍යාගාර ලාම්පුව මේ වන විට භාවිතයට ගෙන ඇත.

(ඇ) Vitreus Scissors – Vertical සහ Vitreus Scissors – Horizontal යන උපකරණ 02 ක 2014 වර්ෂයේ අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු යොදන බව කාරුණිකව දන්වමි.

## 4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

i. උපදේශක විසින් සවිස්තරාත්මකව පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල නොකළද වර්ග අඩි ප්‍රමාණය සහ වර්ග අඩියකට පිරිවැය ඇස්තමේන්තු මුදල රු. 1,100.00 ලෙස එය පදනම් කර ගෙන මුළු පිරිවැය රු. 1,782,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ටෙන්ඩර් පටිපාටිය ක්‍රියාත්මක කරන ලදී. නමුත් මින් ඉදිරියේදී සිදු කරන කොන්ත්‍රාත් වලදී සවිස්තරාත්මක පිරිවැය ඇස්තමේන්තු වෙනම සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.

ii. පරිපාලන නිලධාරීතුමා තාක්ෂණ ඇගයීම් කමිටුවේ සභාපති ලෙස St. Antony's Welding Works සමග සාකච්ඡා කර මෙම මිල අඩු කර ගැනීම සිදු කර ගත්තද මුල් මිල කියුම් සහ සංශෝධිත මිල ගණන් යන දෙකම තාක්ෂණික ඇගයීම් කමිටුවට ඉදිරිපත් කර ඇත. එය තාක්ෂණ ඇගයීම් වාර්තාවේ දැක්වේ.

තාක්ෂණ ඇගයීමේදී පළමු අවම ටෙන්ඩර්කරු ප්‍රතික්ෂේප කිරීමට හේතු 02 ක් ඇත.

1. දෙවන අවම ටෙන්ඩර්කරු දීර්ඝ කාලීනව විශ්වාසවන්තව හා සාර්ථකව වැඩ නිම කර ඇති බවත් කිසිදු අවස්ථාවක වැඩ පැහැර හැර ඇති බව වාර්තා වී නොමැති වීම හා මෙම කාර්ය සාර්ථකව නිම කර ගැනීමට අවශ්‍ය වීම.
2. පළමු හා දෙවන අවම මිල කියුම් වල වෙනස රු. 130,395.00 වැනි අගයක් පමණ වූ නිසා එය හේතු දෙක හා සැසැඳීමේදී එම වෙනස සුළු වෙනසක් වීම.

විගණනයෙන් මේ පිළිබඳ පෙන්වා දීමෙන් පසු අප විසින් ඒ පිළිබඳව තව දුරටත් විශ්ලේෂණය කර බලන ලදී.
එහිදී දෙවන අවම ටෙන්ඩර්කරු වන St. Anthony's Welding Works ගේ සංශෝධිත මිල හා පිරිවැය ඇස්තමේන්තුව අතර වෙනස රු. 8,435.00 ක් තරම් සුළු අගයක් නිසා දෙවන අවම ටෙන්ඩර්කරු තෝරා ගැනීම නිසා රෝහලට විශාල අවාසියක් වී නොමැති බව කාරුණිකව දැනුම් දෙමි.

iii. ගිවිසුමකට අදාළ කොන්දේසි සඳහන් කරමින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ ලිපියක් කොන්ත්‍රාත්කරු වෙත ලබා දෙන ලදී. ඔහු එම කොන්දේසි වලට අනුව කාර්යය නිම කර දී තිබුණි.
මින් ඉදිරියේදී කරන කොන්ත්‍රාත් සඳහා විධිමත් ගිවිසුමක් වෙනම සකස් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි.

4. මින් ඉදිරියේදී කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් බැඳුම්කරයක් ලබා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි.

iv. මින් ඉදිරියේදී කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් බැඳුම්කරයක් ලබා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි.

v. කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට නියමිතව තිබුණේ 2013.03.02 දින පමණ වන විටය.
2013.01.21 වන විට කොන්ත්‍රාත්තුවෙන් 75 % ක් පමණ අවසන් කර කොන්ත්‍රාත්කරු දෙවන පොරොන්දු මුදලින් 50% ක් පමණ ලබා දෙන ලෙස ඉල්ලා ඇත. එම මුදල රු. 700,000.00 ක් වූ අතර මුදල් ගෙවීමට රෝහලේ මුදල් නොමැති විය.

එම රු. 700,000.00 ගෙවීමට හැකි වූයේ 2013.02.20 දිනය. එහිදී අප විසින් ඔහුට දෙවන ගෙවීම වන රු. 700,000 ගෙවීමට සති 4 කින් ප්‍රමාද විය. ඒ අනුව කොන්ත්‍රාත්තුව නිම කිරීමට සති 4 කින් ප්‍රමාද විය. එය රෝහලේ මුදල් ගෙවීම ප්‍රමාද වීම නිසා සිදු වූ බැවින් එයට ප්‍රමාද ගාස්තුවක් අය කිරීමට හැකියාවක් නොමැති විය.

vi. ඉදි කිරීම කරගෙන යන අතරතුර රෝහලේ වෛද්‍යවරුන් විසින් එහි සැලැස්මෙහි වූ කණු අතර දුර ප්‍රමාණය වෙනස් කිරීමට ඉල්ලුම් කරන ලදී. මෙය ප්‍රායෝගික ගැටළුවක් බැවින් එම වෙනස්කම කිරීමට රෝහල තීරණය කරන ලදී. උපදේශක එයට එකඟ නොවිය. නමුත් ඉදිකිරීම අතරමග නතර කළ නොහැකි බැවින් රෝහලේ අවශ්‍යතාවය නිසා එය අඛණ්ඩව කරගෙන යන ලදී.
ඉහත වෙනස්කම සිදු කළ නිසා උපදේශක අවසාන බිල්පත සහතික කිරීම ප්‍රතික්ෂේප කරන ලදී. මෙම ගැටළුව නිසා උපදේශන ගාස්තු වල ඉතිරි මුදල නොගෙවීමට රෝහල විසින් තීරණය කරන ලදී.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය - 2013**

(අ) රෝහලේ කටයුතු ව්‍යාප්ත කිරීමේදී, රෝහලට අනවශ්‍ය පිරිවැයක් දැරීමට සිදු නොවන පරිදි අදාළ තනතුරු සඳහා අවස්ථානුකූලව බඳවා ගනු ලැබේ.

**4.7 සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම**

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂිකව අනුමත කරන ලද පුනරාවර්තන හා ප්‍රාග්ධන අයවැය ඇස්තමේන්තුව මත මහා භාණ්ඩාගාරය මගින් ලබා දෙන මුදලින් පවත්වා ගෙන යනු ලබන මෙම රෝහල විශාල වශයෙන් ආදායම් උපයන ආයතනයක් නොවේ. රෝහලේ දෛනික කටයුතු සඳහා සෑම වර්ෂයකදීම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණයවත් මුදලින් නොලැබෙන තත්ත්වයක් යටතේ එකවර මිලියන 17.6 ක මුදල ආයෝජනය කිරීම ප්‍රායෝගිකව අපහසු කාර්යයක් බැවින් අවස්ථානුකූලව ඉදිරියේදී මෙම කටයුතු සිදු කළ යුතු ආකාරයන් පිළිබඳ කළමණාකාරිත්වයත් සමඟ සාකච්ජා කර සුදුසු පියවර ගනු ලබන බව කාරුණිකව දන්වමි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

නව රසායනාගාර ගොඩනැගිල්ල 2013 වසරේ මුල කාලයේදී ඉදි කිරීම ආරම්භ කිරීම සඳහා තාක්ෂණ ඇගයීම් කමිටු සාමාජිකයන්ද පත් කර තිබුණ අතර එම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා උපදේශන සේවා සපයන NERD ආයතනයේ කාර්ය මණ්ඩල හිගකම සහ කාර්යබහුලත්වය හේතුවෙන් ඔවුන්ට මේ සඳහා මූලිකත්වය දීමට නොහැකි විය. ඒ හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට 2013 සැප්තැම්බර් මස පමණ විය. එම නිසා කොන්ත්‍රාත්තුව පිරිනැමීමට 2013 දෙසැම්බර් දක්වා කාලය ගත විය.

2012 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා අඩු ප්‍රතිපාදන පමණක් භාණ්ඩාගාරයෙන් ලැබූ නිසා 2013 වසරේද 2012 ක්‍රියාකාරී සැලැස්මම ක්‍රියාත්මක විය. එම නිසා විගණනයෙන් පෙන්වා දී ඇති වෛද්‍ය උපකරණ වලින් ප්‍රමුඛතාවය Occulcoherant Tomograpy යන්ත්‍රයට ලබාදී සියළු ප්‍රසම්පාදන කටයුතු නිම කර 2014 ජනවාරි මුල් සතිය තුළ මෙම යන්ත්‍රය රෝහලට සපයන ලදී. Non – Contact Biometry System සහ අනෙකුත් අක්ෂි උපකරණ 2014 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලදී.

### 5.2 අභ්‍යන්තර විගණනය

අවසාන අභ්‍යන්තර විගණනයේ විගණන විමසුම් සඳහා සම්පූර්ණයෙන් පිළිතුරු දී අවසන් වූ වහාම අභ්‍යන්තර විගණනයක් සඳහා අමාත්‍යාංශ විගණන නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.

### 5.3 විගණන කමිටු

විගණන කමිටු රැස්වීම් පැවැත්වීමේ අවශ්‍යතා මත එම කමිටු විධිමත්ව අවම වශයෙන් කමිටු දෙකක් පැවැත්වීමට අවශ්‍ය පියවර ගන්නා බවට 2013 වසර සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරිතුමිය අප දැනුවත් කර ඇත.

### 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

2012 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ගැණුම් ඇණවුම් නිකුත් කර රෝහලට ගෙන්වන ලද පහත වෛද්‍ය උපකරණ සඳහා ගෙවීම් කරන ලද්දේ 2013 වසරේ මුදල් වලිනි.

| උපකරණය | වටිනාකම | රෝහලට ලැබුණු දිනය | මුදල් ගෙවූ දිනය |
|---|---|---|---|
| Fundus Camera | රු. 4,995,000 | 2012.09 | 2013.04 |
| Digital Slit Lamp | රු. 3,100,000 | 2012.09 | 2013.04 |
| | රු. 8,095,000 | | |

එමෙන්ම 2012 ප්‍රසම්පාදන සැලැස්මෙහි සැලැස්මෙහි සමහර අක්ෂි උපකරණ මිලදී ගැනීම නවතා දැමීම හේතුවෙන් රෝහලේ ඊලඟ වැඩිදියුණු කිරීමේ පියවර ලෙස රසායනාගාර උපකරණ දෙකක් මිලදී ගැනීමට කටයුතු යොදන ලදී.

Fully Automated Hematology Analyzer – රු. 2,500,000
Fully Automated Bio Chemistry Analyzer – රු. 8,700,000

මෙම උපකරණ වල වටිනාකම්ද ඇතුලත් කර 2013 ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර ක්‍රියාත්මක කරන ලදී. එම සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මේ භෞතික ප්‍රගතිය පෙන්වන වාර්තාවක් මේ සමඟ ඉදිරිපත් කරමි.

### 5.5 අයවැය ලේඛණමය පාලනය

ගමන් වියදම් (දේශීය) - පසුගිය වර්ෂ කිහිපය තුළ ගමන් වියදම් සඳහා වැඩි මුදලක් ඇස්තමේන්තු කිරීම මත පදනම්ව 2013 වසර සඳහා රු. 300,000 ක් වැනි වැඩි මුදලක් වෙන් කර ඇති අතර මෙවැනි අඩුපාඩු නොවීමට කටයුතු කරන බව දන්වමි.

ලිපි ද්‍රව්‍ය - 2013 වසරේ ලිපි ද්‍රව්‍ය වල අවශ්‍යතාවය ඉහළ යාම හා ලිපි ද්‍රව්‍ය වල මිල ඉහළ යාම මත ඇස්තමේන්තු වියදම 29.27% ඉක්මවා ඇත.

වාහන, යන්ත්‍රෝපකරණ, ගොඩනැගිලි - අවුරුදු 13 ක් පමණ කාලයක් පරිහරණය කරන ලද වාහන, යන්ත්‍රෝපකරණ, ගොඩනැගිලි පවතින බැවින් හදිසි අළුත්වැඩියා වැඩි වශයෙන් ඇතිවේ යැයි බලාපොරොත්තුවෙන් වැඩි මුදලක් ඇස්තමේන්තු කළද එවැනි හදිසි අළුත්වැඩියා සිදු නොවීම හේතුවෙන් ඇස්තමේන්තුව ඉතිරි විය.

තැපැල් හා සන්නිවේදන - තැපැල් හා සන්නිවේදන වල වාර්ෂික වියදම පිළිබඳ ඇගයීමකින් තොරව ඇස්තමේන්තුව සකස් කිරීම නිසා වැඩි මුදලක් ඇස්තමේන්තු කර ඇති අතර මෙවැනි අඩුපාඩු මගහරවා ගෙන අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

## 6. පද්ධති හා පාලන

මෙම ඡේදය යටතේ පෙන්වා දී ඇති දුර්වලතා හැකි තරම් දුරට නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

කාර්යභාර වෛද්‍ය නිලධාරිතුමිය
විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
සීදූව